# දේශීය ණය සහ සංවර්ධන අරමුදල

## වාර්ෂික වාර්තාව සහ ගිණුම්

## 2020

මුදල් අමාත්‍යාංශය

# පටුන


පිටුව

1. ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු සහ අරමුදල් 03
2. ආයතනික තොරතුරු 03
3. කොමසාරිස් මණ්ඩලයේ සංයුතිය 05
4. පාලන ක්‍රියාවලිය 06
5. ආසියානු සංවර්ධන බැංකු ව්‍යාපෘති 09
6. මෙහෙයුම් හා මූල්‍ය කාර්යසාධනය 11
7. විගණන හා කළමනාකරණ කමිටු වාර්තාව 24

**මූල්‍ය ප්‍රකාශ හා තොරතුරු**

8. විගණකාධිපති වාර්තාව 29
9. විස්තීරණ ආදායම් ප්‍රකාශනය 34
10. මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනය 35
11. මුදල් ප්‍රවාහ ප්‍රකාශය 36
12. ගිණුම්කරණ සටහන් 38
13. ගිණුම්කරණ ප්‍රතිපත්ති 61

# වාර්ෂික වාර්තාව සහ ගිණුම් - 2020

දේශීය ණය සහ සංවර්ධන කොමසාරිස් මණ්ඩලය
(දේශීය ණය සහ සංවර්ධන අරමුදල)

## 01. ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණ හා අරමුදල්

### දැක්ම

පළාත් පාලන බල ප්‍රදේශ වල යටිතල පහසුකම් සංවර්ධනය සඳහා මූල්‍ය පහසුකම් සැපයීමේ ප්‍රධාන මූල්‍ය ආයතනය වීම මගින් මෙරට ආර්ථික හා සමාජ සංවර්ධනයට දායක වීම.

### මෙහෙවර

ආර්ථික හා සමාජ සංවර්ධනය සඳහා අත්‍යාවශ්‍ය මූලික පහසුකම් සැපයීමට අවශ්‍ය දිගුකාලීන මූල්‍ය පහසුකම් සපයනු ලබන තිරසාර සහ ස්වාධීන ආයතනයක් බවට පත්වීම.

### අරමුණ

නීතියෙන් බලය ලැබී ඇති පරිදි පළාත් පාලන ආයතන වලට මහජන උපයෝගීතා සේවා පවත්වාගෙන යාම සඳහා සහනදායී පොළියකට මූල්‍ය පහසුකම් සැපයීම සහ අනුබල ලබාදීම.

### අරමුදල්

ණය ලබා දීම සඳහා අවශ්‍ය අරමුදල් සහන පොළී ප්‍රතිශතයක් මත මධ්‍යම රජයේ වාර්ෂික අයවැයෙන් දීර්ඝ කාලීන ණය මුදලක් වශයෙන් 2009 වර්ෂය දක්වා ලබාගන්නා ලදී. තවද ආසියානු සංවර්ධන බැංකු ණය අංක 1632 SRI (SF) යටතේ ක්‍රියාත්මක වූ නාගරික සංවර්ධන සහ අඩු ආදායම් නිවාස ව්‍යාපෘතිය සහ ණය අංක 2201 SRI (SF) යටතේ ක්‍රියාත්මක වූ පළාත් පාලන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ අරමුදල් ණය නිකුත් කිරීම සඳහා උපයෝගී කරගනු ලැබේ.

## 02. ආයතනික තොරතුරු

### සංස්ථාපනය

1916 අංක 22 දරණ ආඥා පනත යටතේ ආරම්භ කරන ලදුව, 1930 අංක 06, 1931 අංක 25, 1938 අංක 43, 1942 අංක 21 දරණ ආඥා පනත්, සහ 1949 අංක 29 දරණ පනත, 1974 අංක 09 දරණ නීතිය සහ 1993 අංක 24 දරණ පනත යන පනත් වලින් සංශෝධිත දේශීය ණය සහ සංවර්ධන අරමුදල ව්‍යවස්ථාපිත ආයතනයකි. මෙම ආයතනය 2020 වර්ෂයේ සිට මුදල් අමාත්‍යාංශය යටතේ පාලනය වේ.

කාර්යභාරය

ශ්‍රී ලංකාව තුළ මහ නගර සභා 24, නගර සභා 41 සහ ප්‍රාදේශීය සභා 276 ලෙස සංස්ථාපනය කර ඇති පළාත් පාලන ආයතන 341 න් 340 ක් (කොළඹ මහ නගර සභාව හැර) සඳහා ප්‍රාග්ධන ආයෝජන සඳහා අවශ්‍ය දිගුකාලීන මූල්‍ය පහසුකම් සහනදායී පොළී පදනමක් මත සැපයීම මූලික කාර්යභාරය වේ.

| | |
|---|---|
| ලියාපදිංචි ස්ථානය | **නො. 24/A, වෝඩ් පෙදෙස, කොළඹ 07** |
| දුරකථනය | 011-2687514 |
| ෆැක්ස් | 011-2691261 |
| විද්‍යුත් තැපැල් | lldf1916@gmail.com |

**විගණකවරු :** විගණකාධිපති දෙපාර්තමේන්තුව

**අභ්‍යන්තර විගණනය :** අභ්‍යන්තර විගණන අංශය<br>පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය

**බැංකුකරුවෝ :** ලංකා බැංකුව

**කාර්ය මණ්ඩලය**

2020 දෙසැම්බර් 31 දිනට අරමුදලේ කාර්ය මණ්ඩලය පහත පරිදි වේ.

| තනතුර | 2020.12.31 දිනට සේවක සංඛ්‍යාව |
|---|---|
| අධ්‍යක්ෂ | 01 |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ (මූල්‍ය සහ පරිපාලන) | 01 |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ (මෙහෙයුම්) | 01 |
| සහකාර ගණකාධිකාරී | 01 |
| පරිපාලන නිලධාරී | 01 |
| සංවර්ධන නිලධාරී | 20 |
| කළමනාකරණ සහකාර | 10 |
| රියදුරු | 02 |
| කාර්යාල කාර්ය සහායක | 02 |
| **එකතුව** | **39** |

# 03. කොමසාරිස් මණ්ඩලයේ සංයුතිය

1993 අංක 24 දරණ දේශීය ණය සහ සංවර්ධන (සංශෝධිත) පනතේ 2 වගන්තිය ප්‍රකාර කොමසාරිස් මණ්ඩලය ගරු අමාත්‍යතුමා විසින් පත්කරනු ලබන අවම වශයෙන් සාමාජිකයින් 14 දෙනෙකුගෙන් සමන්විත විය යුතුය.

(අ) සභාපති - විෂයභාර අමාත්‍යාංශයේ ලේකම්.
(ආ) මුදල් විෂයභාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන එක් අයෙකු.
(ඇ) එක් එක් පළාත් සභාවල ආණ්ඩුකාරවරුන් විසින් නම් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් 09 දෙනෙකු.
(ඈ) ගරු අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන තිදෙනෙකු.

## 2020.12.31 දිනට කොමසාරිස් මණ්ඩලය

**සභාපති**

01. ආර්.එම්.පී.රත්නායක මහතා - භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්, මුදල් අමාත්‍යාංශය

**භාණ්ඩාගාර නියෝජනය**

02. එම්.ඒ.එම්.අන්ෆාස් මහතා - නියෝජ්‍ය අධ්‍යක්ෂ, ව්‍යාපෘති කළමනාකරණ සහ අධීක්ෂණ දෙපාර්තමේන්තුව, මුදල් අමාත්‍යාංශය

**සාමාජිකයින්**

| | | | |
|---|---|---|---|
| 03 | ගාමිණී රාජරත්න මහතා | ප්‍රධාන ලේකම් | (මධ්‍යම පළාත) |
| 04 | එච්.එම්.පී.බණ්ඩාර මහතා | ප්‍රධාන ලේකම් | (උතුරු මැද පළාත) |
| 05 | පී.බී.විජයරත්න මහතා | ප්‍රධාන ලේකම් | (ඌව පළාත) |
| 06 | එම්.ඩී.රන්ජනී ජයකොඩි මහත්මිය | ප්‍රධාන ලේකම් | (සබරගමුව පළාත) |
| 07 | තුසිත් පී. වනසිංහ මහතා | ප්‍රධාන ලේකම් | (නැගෙනහිර පළාත) |
| 08 | ආර්.සී.ද සොයිසා මහතා | ප්‍රධාන ලේකම් | (දකුණු පළාත) |
| 09 | පී.බී.එම්.සිරිසේන මහතා | ප්‍රධාන ලේකම් | (වයඹ පළාත) |
| 10 | ජයන්ති විජේතුංග මහත්මිය | ප්‍රධාන ලේකම් | (බස්නාහිර පළාත) |
| 11 | එම්.පී.දිරන්ජන් මහතා | පළාත් පාලන කොමසාරිස් | (උතුරු පළාත) |
| 12 | ඩබ්.බී.එම්.ආර්.එස්.ඒ.අළුවිහාරේ මහතා | ගරු අමාත්‍යතුමා විසින් පත්කරන ලද | |
| 13 | ඒ.ඩී.කේ.ගුරුගේ මහතා | ගරු අමාත්‍යතුමා විසින් පත්කරන ලද | |
| 14 | ඒ.බී.හේරත් මහතා | ගරු අමාත්‍යතුමා විසින් පත්කරන ලද | |

# 04. පාලන ක්‍රියාවලිය

ආයතනයේ පාලන ක්‍රියාවලිය කොමසාරිස් මණ්ඩලය මගින් ක්‍රියාත්මක වන සංයුක්ත ක්‍රියාවලියක් වශයෙන් හැඳින්විය හැකිය. පාලන ක්‍රමයක වැදගත්ම අංගය වන මෙය ආයතනයේ ඒකාබද්ධ සාර්ථකත්වය සහ අඛණ්ඩ ආර්ථිකමය පැවත්මට ඉවහල් වේ. දේශීය ණය සහ සංවර්ධන අරමුදලේ කොමසාරිස් මණ්ඩලය, ඒකාබද්ධ පාලන ක්‍රියාවලිය පවත්වා ගැනීම මගින් ව්‍යාපාරික ආචාර ධර්ම, පාරදෘශ්‍යතාවය සහ ඉහළ වගකීම් තත්වයන් පවත්වාගැනීම සඳහා බැඳී ඇත.

**කොමසාරිස් මණ්ඩලය**

**සංයුතිය**

කොමසාරිස් මණ්ඩලය සභාපති ඇතුළු දාහතර දෙනෙකුගෙන් සමන්විත වන අතර ඔවුන්ගේ විශේෂිත දැනුම සහ පළපුරුද්ද ආයතනයේ ව්‍යාපාරික ක්‍රියාවලියට උපකාරී වේ. කොමසාරිස් මණ්ඩල සාමාජිකයින් කිසිවකු ආයතනය සමග ගනුදෙනු වලට සම්බන්ධ නොවන අතර, එය ඔවුන්ගේ කාර්යයන් ඉටුකිරීමේදී ස්වාධීනත්වය පවත්වාගෙන යාමට ඉවහල් වී ඇත.

**තීරණ ගැනීම**

කොමසාරිස්මණ්ඩල සාමාජිකයින් අවශ්‍යතාවය මත මසකට වරක් රැස්වන අතර එහිදී එදිනෙදා කටයුතු ද විමර්ෂනයට භාජනය කරන අතරම සුවිශේෂ වැදගත් ප්‍රතිපත්තිමය තීරණ ද ගනු ලැබේ. තවද කොමසාරිස් මණ්ඩල සාමාජිකයින් විසින් ආයතනික අරමුණු ලඟා කර ගැනීමට අදාළ වන උපාය මාර්ගද තීරණය කරනු ලබයි.

**වගකීම**

1. ආයතනික ශක්තිය, කාර්යක්ෂමතාව සහ අවදානම සැලකිල්ලට ගනිමින් ව්‍යාපාර උපාය මාර්ග සැකසීම.
2. ඉහත උපායමාර්ග ක්‍රියාත්මක කිරීම සහ අධීක්ෂණය.
3. පවතින ක්‍රමවේදයේ ක්‍රියාකාරීත්වයට අදාළව අවදානම් කළමනාකරණය, අභ්‍යන්තර පාලනය, ආචාරධර්ම, පවතින නීති සහ ව්‍යවස්ථාවලට අනුකූලතාවය දක්වන බවට වගබලාගැනීම.
4. ප්‍රාග්ධන වියදම් නිරීක්ෂණ සහ අභිමන්ත්‍රණය හා සමාලෝචනය.
5. ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වයේ කාර්යසාධනය අධීක්ෂණය.
6. තොරතුරු ක්‍රමවේදය සහ විගණන ක්‍රියාවළිය ඵලදායී ලෙස ක්‍රියාත්මක වන බවට වගබලා ගැනීම.

**ස්වාධීන විනිශ්චය**

කොමසාරිස් මණ්ඩලයේ ක්‍රියාකාරකම් වලදී සෑම කොමසාරිස්වරයෙකුම තම ස්වාධීන මතය ප්‍රකාශ කළ යුතු අතර, අනෙක් පාර්ශව වල අයුතු බලපෑම් වලට හෝ අගති ගාමී බලපෑම් වලට යටත් නොවිය යුතුය. උපායමාර්ග පිලිබඳ තීරණ ගැනීම, උපාය මාර්ග ක්‍රියාවට නැංවීම, කාර්යසාධන සමාලෝචනය, සම්පත් බෙදාහැරීම සහ ව්‍යාපාරික ආචාරධර්ම පවත්වාගෙන යාම ආදී කටයුතු සඳහා කොමසාරිස් වරුන් අවධානය යොමුකළ යුතු වේ.

**සභාපති**

සභාපතිගේ කාර්යභාරය පැහැදිළිව විස්තර කර වෙන්කර දක්වා ඇති අතර, එමගින් ආයතනය තුල බල තුලනයක් සහතික කිරීමට හැකිවීම නිසා පුද්ගලයන්ගේ තනි කැමැත්ත අනුව තීරණ ගැනීමේ ස්වභාවය සීමාවී ඇත.

**සභාපතිගේ කාර්යභාරය**

කොමසාරිස් මණ්ඩලය වෙත නායකත්වය ලබාදීම සහ උපායමාර්ගික මගපෙන්වීමත් සියළුම ආකාරයේ රැස්වීම් වෘත්තීමය තත්වයෙන් සිදුකරන බවට වගබලා ගැනීමත් සභාපති විසින් කළ යුතුය.

**කොමසාරිස් මණ්ඩලය පත්කිරීම**

කොමසාරිස් මණ්ඩලය පත්කිරීමේ ක්‍රියා පටිපාටිය ඉතා පැහැදිලි විනිවිද භාවයෙන් යුක්ත වන අතර, එය අදාළ ආඥා පනත අනුව පැහැදිලි කර ඇත.

**විගණනය සහ වගකීම**

**ආයතනික තත්වය සහ අනාගතය ඇගයීම**

ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය ද සහිතව මෙම ආයතනයේ අනාගත දැක්මට අනුව රාජ්‍ය අංශයේ "සී" පංතියේ ආයතනයක් වශයෙන් කටයුතු කරගැනීම සඳහා ආයතනයේ කාර්යය මණ්ඩලය ප්‍රතිව්‍යුහගතකර ඇත.

**මනා අභ්‍යන්තර පාලන ක්‍රම පවත්වාගෙන යාම හා අවදානම් කළමනාකරණය**

කොමසාරිස් වරුන් විසින් ක්‍රියාවට නංවන ලද අභ්‍යන්තර පාලනය සහ අවදානම් කළමනාකරණය මගින් ආයතනයේ ආයෝජන සහ වත්කම් සුරක්ෂිත භාවය තහවුරු කර ඇත. තවද අභ්‍යන්තර පාලන ක්‍රම වල පවතින ආවේණික අඩුපාඩු හේතුකොටගෙන ඇතිවන වැරදි සහ වංචා සම්බන්ධව කොමසාරිස් මණ්ඩලය දැණුවත් වීම සඳහා ක්‍රමවේදයක් ක්‍රියාත්මකව ඇත.

**අභ්‍යන්තර පාලන ක්‍රම වල ප්‍රමාණවත් භාවය සහ සඵල තාවය සම්බන්ධව කලින් කල සිදුකරන විමර්ශන**

කොමසාරිස් වරුන් සහ ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන් විසින් සිදුකරන විමර්ෂණ ඇසුරින් අභ්‍යන්තර පාලන ක්‍රම වල ප්‍රමාණවත් භාවය සහ සඵල තාවය සම්බන්ධ නිරීක්ෂණ පාලක මණ්ඩලයට යොමුකරන අතර පාලක මණ්ඩලය මගින් නියමිත ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර ඇත.

**මූල්‍ය ප්‍රකාශ වාර්තාකරණය**

පාලක මණ්ඩල කොමසාරිස්වරුන් විසින් ආයතනයේ මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ගිණුම්කරණ ප්‍රමිත (SLFRS) වලට අනුකූලව සකස්කර ඇති බවට සහතික කරන අතර, මූල්‍ය ප්‍රකාශ වාර්තාකරණය දැනට පවතින අදාළ නීති සහ ක්‍රියාත්මක භාවයන්ට අනුකූලව සිදු කර ඇත. එමෙන්ම මූල්‍ය ප්‍රකාශ විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් විගණනය කර ඇති බවටද සහතික කරයි.

**අඛණ්ඩ පැවැත්ම**

දේශීය ණය සහ සංවර්ධන අරමුදල නියමිත ද්‍රවශීලතා තත්වයන් යටතේ එහි රාජකාරී කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යනු ලැබේ.

**ව්‍යවස්ථාපිත බැඳීම්**

කොමසාරිස් වරුන් විසින් ඔවුන්ගේ දැනුම සහ විශ්වාසයට අනුව රජයට ඇති මූල්‍යමය බැඳීම් හා ව්‍යවස්ථාමය වශයෙන් සේවකයන්ට ඇති බැඳීම් සඳහා නියමිත ගෙවීම් කර ඇති බව හෝ ඒ සම්බන්ධයෙන් ප්‍රමාණවත් ප්‍රතිපාදන ආයතනයේ මූල්‍ය ප්‍රකාශන වල සලසා ඇති බව සම්බන්ධයෙන් සෑහීමකට පත්වේ.

**අනෙකුත් පාර්ශවයන් සමග ඇති සම්බන්ධතාවය**

**සේවකයන්**

පාලක මණ්ඩලය විසින් සම්පාදිත ආයතනයේ දැක්ම, අරමුණු සහ පරමාර්ථ සම්බන්ධව ආයතනයේ සියළුම නිලධාරීන් දැනුවත් වී ඇත. අවම වයස් සීමාවට අඩු කිසිම පුද්ගලයෙකුට ආයතනයේ රැකියා අවස්ථා සලසා නොමැත. ආයතනයේ රැකියා අවස්ථා සහ උසස්වීම් සඳහා ජාතිය, ලිංගභේදය ආදී වෙනස්කම් සැලකිල්ලට භාජනය නොකෙරේ.

**නියාමන ආයතන**

මහා භාණ්ඩාගාරය, අදාළ අමාත්‍යාංශය සහ දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සමග අර්ථවත් සම්බන්ධතාවයක් පවත්වාගෙන යාම සම්බන්ධව පාලක මණ්ඩලය සහතික වී ඇත. ආයතනයේ පැවැත්ම සහ ක්‍රියාකාරීත්වය අදාළ ආයතන මගින් නිකුත් කරන නීති සහ නියෝග නිසි පිළිපැදීම මගින් සහ රටේ පවතින නීතිවලට අනුකූලතාව දැක්වීමෙන් සාක්ෂාත් වී ඇත.

**පරිසරය**

ආයතනය සහ නිලධාරීන් පිළිගත් සම්මත උපයෝගී කරගැනීම මගින් පරිසර පද්ධතිය මනා ලෙස පවත්වාගෙන යාම සම්බන්ධයෙන් පාලක මණ්ඩලය විසින් විශේෂ සැලකිල්ල යොමු කොට ඇත.

**තිරසාර සංවර්ධන අභිමතාර්ථ**

2017 අංක 19 දරණ තිරසර සංවර්ධන පනත මගින් නීතිගතකර ඇති සහශ්‍ර සංවර්ධන අභිමතාර්ථ හඳුනාගෙන එම ඉලක්ක සපුරාගැනීම සඳහා ක්‍රියාකාරී සැලැස්ම සහ වැඩපිළිවෙලක් සකස්කොට ඇත.

# 05. ආසියානු සංවර්ධන බැංකු ව්‍යාපෘති

**ආසියානු සංවර්ධන බැංකු ණය අංක 1632 SRI (SF) - (UDLIHP)**
**නාගරික සංවර්ධන සහ අඩු ආදායම් නිවාස ව්‍යාපෘතිය**

නාගරික සංවර්ධන අමාත්‍යාංශය යටතේ 1998 වර්ෂයේ සිට 2002 දක්වා ක්‍රියාත්මක කරනු ලැබූ ඉහත ව්‍යාපෘතිය යටතේ ලබාදුන් ණය ආපසු අය කර ගැනීමේ ආයතනය වශයෙන් දේශීය ණය සහ සංවර්ධන අරමුදල කටයුතු කරනු ලබයි. මෙම ව්‍යාපෘතිය යටතේ පළාත් පාලන ආයතන 27 ක් සඳහා නිකුත්කළ ණය වල වටිනාකම රු.මි.2,270 ක් වේ. මෙම ව්‍යාපෘති අතුරින් **90%** ක ණය අයකිරීම් කරගෙන යනු ලබන අතර ඉතිරි ව්‍යාපෘති වල ණය ආපසු අයකිරීමේ ගැටළු පැන නැගී ඇත. මීට ප්‍රධාන හේතුව වශයෙන් දැක්විය හැක්කේ මෙම ව්‍යාපෘතිය යටතේ ඉදිකරන ලද වෙළඳ සංකීර්ණ අසාර්ථක වීමත් අනෙකුත් ව්‍යාපෘති කිහිපයක් සම්බන්ධයෙන් ද විවිධ ගැටළු පැනනැගී ඇති වීමත්ය.

**වගු අංක 5.1 : පසුගිය වසර 05 ක ණය අයකිරීමේ ප්‍රගතිය** (UDLIHP)

(රු.මි)

| වර්ෂය | ණය වාරික අයකිරීම් | පොළී අයකිරීම් |
|---|---|---|
| 2016 | 97.1 | 70.9 |
| 2017 | 74.0 | 68.3 |
| 2018 | 84.5 | 67.6 |
| 2019 | 96.0 | 68.1 |
| 2020 | 100.9 | 62.0 |

**ආසියානු සංවර්ධන බැංකු ණය අංක 2201 SRI (SF) - (LGIIP)**
**පළාත් පාලන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය**

2006 සිට 2012 දක්වා ක්‍රියාත්මක වූ ආසියානු සංවර්ධන බැංකු ණය අංක 2201 SRI (SF) දරණ පළාත් පාලන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ පළාත් පාලන ආයතන වෙත ණය නිකුත් කිරීම සහ එම ණය ආපසු අයකරගැනීමේ කාර්යය දේශීය ණය සහ සංවර්ධන අරමුදල වෙත පැවරී ඇත. මේ සඳහා 2006 ජනවාරි මස ආසියානු සංවර්ධන බැංකුව සහ දේශීය ණය සහ සංවර්ධන අරමුදල අතර ව්‍යාපෘති ගිවිසුම අත්සන් කරන ලදී. ඉහත ව්‍යාපෘතිය යටතේ නාගරික යටිතල පහසුකම් සහ මූලික නාගරික සේවා වැඩිදියුණු කිරීම හා පුළුල් කිරීමේ කාර්යයන් ඇතුලත් වේ. ඒ යටතේ ප්‍රධාන ක්ෂේත්‍ර 05ක් හඳුනාගෙන තිබුණි.

1. ග්‍රාමීය ජල සම්පාදනය
2. පළාත් පාලන ආයතන වලට අයත් මාර්ග සංවර්ධනය
3. ඝන අපද්‍රව්‍ය කළමනාකරණය
4. නාගරික ජලාපවහන සහ මළාපවහන පද්ධතිය සංවර්ධනය
5. කුඩා පරිමාණ ප්‍රජා යටිතල පහසුකම් (මූලික සෞඛ්‍ය සායන හා පුස්තකාල ආදිය)

උක්ත ව්‍යාපෘතිය පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශයයෙන් මෙහෙයවූ අතර පළාත් පාලන ආයතන වෙත ණය නිකුත් කිරීම සහ එම ණය ආපසු අයකරගැනීමේ කාර්යය දේශීය ණය සහ සංවර්ධන අරමුදල වෙත පැවරී ඇත. මේ සඳහා වෙන් කරන ලද මුළු මුදල ඇමරිකානු ඩොලර් මිලියන 42.5 කි. මෙය 100% ක ණය මුදලක් වශයෙන් දේශීය ණය සහ සංවර්ධන අරමුදලට මහා භාණ්ඩාගාරයෙන් ලැබෙන අතර, වසර 08ක සහන කාලයක් සමග වසර 32 කින් මහා භාණ්ඩාගාරය වෙත නැවත ගෙවිය යුතුය. සහන කාලය තුලදී පොළී අනුපාතය 1% ක් වන අතර සහන කාලයෙන් පසු 1.5% කි.

මෙම ව්‍යාපෘතිය යටතේ පළාත් පාලන ආයතන වෙත ලබාදුන් ව්‍යාපෘති සඳහා ණය සහ ප්‍රදාන වශයෙන් කොටස් 02 කි. පළාත් පාලන ආයතන වල වර්ගීකරණය අනුව ණය මුදල 33% සිට 53% දක්වා වන අතර, ප්‍රදානය 40% සිට 60% දක්වා වේ. යටකී ප්‍රදානය දැරිය යුතුව ඇත්තේ ණය සඳහා වන 9% ක පොළී මුදලිනි. මේ අනුව මෙම ව්‍යාපෘතිය යටතේ දේශීය ණය සහ සංවර්ධන අරමුදල ඉතා විශාල අවදානමක් දැරිය යුතුව ඇත.

උප ව්‍යාපෘති ශක්‍යතාවය පළාත් පාලන ආයතනවල ඉදිරි ආදායම් මත නිගමනය වේ. මූල්‍ය සහ පළාත් පාලන ක්‍රියාකාරී සැලැස්ම සහ හැකියා වර්ධන ක්‍රියාකාරකම් අත්‍යවශ්‍ය අංග වන අතර එම අංග ක්‍රියාත්මක වීම මගින් දේශීය ණය සහ සංවර්ධන අරමුදලේ ණය අයකරගැනීම සුරක්ෂිතතාවය සහතික වන අතරම, ණය පැහැර හැරීමේ අවදානම අඩුවේ. ඒ අතරම ණය ආපසු ගෙවීම් නිසි පරිදි සිදුවීමට පළාත් පාලන ආයතන වල මූල්‍ය තත්වය ශක්තිමත් හා තිරසර විය යුතුය. එමෙන්ම අරමුදලෙන් නැවත ණය ලබාගැනීම සඳහා එකී ශක්‍යතාවය වැදගත්වේ. පළාත් පාලන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියෙහි අරමුණ ඉහත පරිදි වේ.

මෙම ව්‍යාපෘතිය යටතේ පළාත් පාලන ආයතන වෙත නිකුත්කළ ණය සහ ප්‍රධානයන්ගේ වටිනාකම රු.මි.4,654 ක් වන අතර පළාත් පාලන ආයතන වර්ගය අනුව ණය සහ ප්‍රදාන ලබාදී ඇති ආකාරය පහතින් දැක්වේ.

**වගු අංක 5.2 : පළාත් පාලන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ ණය සහ ප්‍රදාන බෙදී ගොස් ඇති ආකාරය (LGIIP)**

| පළාත් පාලන ආයතන වර්ගය | ණය මුදල | % | ප්‍රදානය | % | එකතුව | % |
|---|---|---|---|---|---|---|
| මහ නගර සභා | 254 | 53 | 192 | 40 | 433 | 93 |
| නගර සභා | 263 | 43 | 306 | 50 | 543 | 93 |
| ප්‍රාදේශීය සභා | 1,291 | 33 | 2,348 | 60 | 3,678 | 93 |
| එකතුව | 1,808 | | 2,846 | | 4,654 | |

# 06. මෙහෙයුම් හා මූල්‍ය කාර්යසාධනය

## 6.1 මෙහෙයුම් කාර්යසාධනය

### 2020 වර්ෂයේ කාර්යසාධනය

2020 වර්ෂයේදී පළාත් පාලන ආයතන වෙත ණය දීම සඳහා රු.මි.800 ක මුදලක් ඇස්තමේන්තු ගතකර තිබුණි. වර්ෂය තුලදී පළාත් පාලන ආයතන 23 ක් වෙත නිකුත් කළ මුළු ණය වටිනාකම රු.මි.614.3 කි. මෙම ණය මුදල් සහනදායී පොළී ප්‍රතිශතයක් මත වසර 5 -10 කින් ආපසු ගෙවිය යුතුවේ.

වගු අංක **6.1.1** : 2020 වර්ෂය තුලදී ණය නිකුත් කිරීමේ සාරාංශය


| | ව්‍යාපෘති වර්ගය | පොළී ප්‍රතිශතය (වාර්ෂික) | මුදල (රු.) | ව්‍යාපෘති සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 01 | මාර්ග නඩත්තු ඒකක පිහිටුවීම | 9.0% | 67,500,000 | 06 |
| 02 | ආදාහනාගාර ඉදිකිරීම | 6.5% | 4,986,000 | 01 |
| 03 | පොදු වෙළඳපළ ඉදිකිරීම | 9.0% | 462,832,178 | 05 |
| 04 | මහජන පුස්තකාල ඉදිකිරීම | 7.0% | 28,226,988 | 03 |
| 05 | පාරිසරික සංචාරක ව්‍යාපෘති | 9.0% | 3,620,440 | 01 |
| 06 | සූර්ය කෝෂ පද්ධති | 7.0% | 10,181,600 | 03 |
| 07 | පානීය ජල ව්‍යාපෘති | 7.0% | 17,000,000 | 01 |
| 08 | කසළ අපහරණ ව්‍යාපෘති සඳහා වාහන මිලදී ගැනීම | 9.0% | 16,680,000 | 01 |
| 09 | වෙනත් ආදායම් උත්පාදක ව්‍යාපෘති | 9.0% | 3,309,276 | 02 |
| | **එකතුව** | | **614,336,482** | **23** |

## වගු අංක 6.1.2 : දේශීය ණය සහ සංවර්ධන අරමුදල
## 2020.12.31 දිනට ණය නිකුත් කිරීම (විස්තරාත්මකව)

| | පළාත් පාලන ආයතනය | පළාත | මුදල (රු.) | පානීය ජල ව්‍යාපෘති | කසළ ව්‍යාපෘති සඳහා වාහන මිලදී ගැනීම | සූර්ය කෝෂ පද්ධති | පාරිසරික සංචාරක ව්‍යාපෘති | ආදාහනාගාර ඉදිකිරීම | මාර්ග සංවර්ධනය සඳහා අවශ්‍ය යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම | පොදු වෙළඳ සංකීර්ණ ඉදිකිරීම | කාර්යාල ගොඩනැගිලි සහ මහජන පුස්තකාල ඉදිකිරීම | වෙනත් ආදායම් උත්පාදක ව්‍යාපෘති |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | වරකාපොල ප්‍රා.ස | සබරගමුව | 6,229,462 | - | - | - | - | - | - | - | 6,229,462 | - |
| 2 | මුලටියන ප්‍රා.ස | දකුණු | 10,000,000 | - | - | - | - | - | 10,000,000 | - | - | - |
| 3 | කරුවලගස්වැව ප්‍රා.ස | වයඹ | 17,000,000 | 17,000,000 | - | - | - | - | - | - | - | - |
| 4 | වැලිගෙපොල ප්‍රා.ස | සබරගමුව | 9,832,526 | - | - | - | - | - | - | - | 9,832,526 | - |
| 5 | වලපනේ ප්‍රා.ස | මධ්‍යම | 2,284,000 | - | - | - | - | - | - | - | - | 2,284,000 |
| 6 | මහනුවර ම.න.ස | මධ්‍යම | 172,869,158 | - | - | - | - | - | - | 172,869,158 | - | - |
| 7 | කටාන ප්‍රා.ස | බස්නාහිර | 12,165,000 | - | - | - | - | - | - | - | 12,165,000 | - |
| 8 | කෑගල්ල ප්‍රා.ස | සබරගමුව | 1,319,020 | - | - | - | - | - | - | 1,319,020 | - | - |
| 9 | පුත්තලම න.ස | වයඹ | 95,860,000 | - | - | - | - | - | - | 95,860,000 | - | - |
| 10 | වනාතවිල්ලුව ප්‍රා.ස | වයඹ | 20,000,000 | - | - | - | - | - | 20,000,000 | - | - | - |
| 11 | කොටිකාවත්ත ප්‍රා.ස | බස්නාහිර | 16,680,000 | - | 16,680,000 | - | - | - | - | - | - | - |
| 12 | කොත්මලේ ප්‍රා.ස | මධ්‍යම | 3,620,440 | - | - | - | 3,620,440 | - | - | - | - | - |
| 13 | කුරුණෑගල ම.න.ස | වයඹ | 4,986,000 | - | - | - | - | 4,986,000 | - | - | - | - |
| 14 | කුලියාපිටිය න.ස | වයඹ | 188,684,000 | - | - | - | - | - | - | 188,684,000 | - | - |
| 15 | පස්ගොඩ ප්‍රා.ස | දකුණු | 7,500,000 | - | - | - | - | - | 7,500,000 | - | - | - |
| 16 | දෙහිඅත්තකණ්ඩිය ප්‍රා.ස | නැගෙනහිර | 1,025,276 | - | - | - | - | - | - | - | - | 1,025,276 |
| 17 | සීතාවක ප්‍රා.ස | බස්නාහිර | 3,285,600 | - | - | 3,285,600 | - | - | - | - | - | - |
| 18 | තිහගොඩ ප්‍රා.ස | දකුණු | 3,380,000 | - | - | 3,380,000 | - | - | - | - | - | - |
| 19 | කලවාන ප්‍රා.ස | සබරගමුව | 10,000,000 | - | - | - | - | - | 10,000,000 | - | - | - |
| 20 | බේරුවල ප්‍රා.ස | බස්නාහිර | 10,000,000 | - | - | - | - | - | 10,000,000 | - | - | - |
| 21 | බෙන්තොට ප්‍රා.ස | දකුණු | 4,100,000 | - | - | - | - | - | - | 4,100,000 | - | - |
| 22 | මාතර ප්‍රා.ස | දකුණු | 10,000,000 | - | - | - | - | - | 10,000,000 | - | - | - |
| 23 | මාතර ප්‍රා.ස | දකුණු | 3,516,000 | - | - | 3,516,000 | - | - | - | - | - | - |
| | එකතුව | | **614,336,482** | **17,000,000** | **16,680,000** | **10,181,000** | **3,620,440** | **4,986,000** | **67,500,000** | **462,832,178** | **28,226,988** | **3,309,276** |

**වගු අංක 6.1.3 : ණය නිකුත් කිරීම - පළාත් අනුව**
**2020 වර්ෂය**

| පළාත | මුදල (රු.) | ප්‍රතිශතය (%) |
|---|---|---|
| බස්නාහිර | 42,130,600 | 7.0 |
| මධ්‍යම | 178,773,598 | 29.0 |
| නැගෙනහිර | 1,025,276 | 0.2 |
| දකුණු | 38,496,000 | 6.3 |
| සබරගමුව | 27,381,008 | 4.5 |
| වයඹ | 326,530,000 | 53.0 |
| **එකතුව** | **614,336,482** | |





**රූප සටහන 6.1.3 - පළාත් අනුව ණය නිකුත් කිරීමේ ප්‍රගතිය**

වගු අංක 6.1.4 : **ණය නිකුත් කිරීම - 2020 වර්ෂය**

පළාත් පාලන ආයතන වර්ගය අනුව

| පළාත් පාලන ආයතන වර්ගය | මුදල (රු.) | ප්‍රතිශතය (%) |
|---|---|---|
| මහ නගර සභා | 177,855,158 | 29 |
| නගර සභා | 284,544,000 | 46 |
| ප්‍රාදේශීය සභා | 151,937,324 | 25 |
| එකතුව | 614,336,482 | |




රූප සටහන 6.1.4 - පළාත් පාලන ආයතන වර්ගය අනුව ණය නිකුත් කිරීමේ ප්‍රගතිය


**ණය ආපසු අයකිරීම**


2020 වර්ෂය තුලදී දේශීය ණය සහ සංවර්ධන අරමුදලේ චක්‍රීය අරමුදල් වලින් ලබාදුන් ණය වලින් ණය වාරික වශයෙන් රු.මි.328.1 ක් ද පොළී මුදල් වශයෙන් රු.මි.130.5 ක් ද පළාත් පාලන ආයතනයන්ගෙන් ආපසු අයකරගෙන ඇත. නාගරික සංවර්ධන සහ අඩු ආදායම් නිවාස ව්‍යාපෘතිය තුලින් රු.මි.100.9 ක් ණය වාරික වශයෙන් ද රු.මි.62.0 ක් පොළී වශයෙන් ද අයකරගෙන ඇත. තවද බහු වාර්ෂික භෝග සංවර්ධන ව්‍යාපෘතිය තුලින් රු.මි.2.5 ක් ණය වාරික වශයෙන් ද රු.මි.4.0 ක් පොළී වශයෙන් ද අයකරගෙන ඇත. පළාත් පාලන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ රු.මි.186.2 ක් වාරික වශයෙන්ද රු.මි.62.5 ක් පොළී වශයෙන් ද ආපසු අයකරගෙන ඇත.

**වගු අංක 6.1.5 : ණය ආපසු අයකිරීමේ ප්‍රගතිය - 2020**

(රු.මි)

| | වාරික අයකිරීම් | පොළී අයකිරීම් | එකතුව |
|---|---|---|---|
| **LLDF** | 328.1 | 130.5 | **458.6** |
| **PCDP** | 2.5 | 4.0 | **6.5** |
| **UDLIHP** | 100.9 | 62.0 | **162.9** |
| **LGIIP** | 186.2 | 62.5 | **248.7** |
| **එකතුව** | **617.7** | **259** | **876.7** |








**රූප සටහන 6.1.5 - ණය වාරික සහ පොළී මුදල් අයකිරීමේ ප්‍රගතිය**

**දේශීය ණය සහ සංවර්ධන අරමුදල**
**වගු අංක 6.1.6 : කාර්ය සාධනය 2016 – 2020**
**(ආසියානු සංවර්ධන බැංකු ව්‍යාපෘති හැර)**

**(රු.000)**

| වර්ෂය | නිකුත් කළ ණය | ණය වාරික අයකිරීම් | ණය පොළී අයකිරීම් |
|---|---|---|---|
| **2016** | 144,648 | 138,011 | 75,351 |
| **2017** | 403,477 | 205,621 | 123,938 |
| **2018** | 403,141 | 250,880 | 90,470 |
| **2019** | 652,381 | 241,004 | 107,627 |
| **2020** | 614,336 | 328,177 | 130,502 |




**රූප සටහන 6.1.6 - කාර්යසාධනය 2016 - 2020**

## 6.2 මූල්‍ය කාර්යසාධනය

### ආදායම - 2020 වර්ෂය

වර්ෂය තුල උපයාගන්නා ලද දළ ආදායම රු.මි.143 කි (ආසියානු සංවර්ධන බැංකු ව්‍යාපෘති මගින් නිකුත්කළ ණය මුදල් ද ඇතුළුව). ආයතනයේ පරිපාලන වියදම් සහ පළාත් පාලන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ පළාත් පාලන ආයතන වලට ලබාදී ඇති ප්‍රදානයන් වෙන් කිරීමෙන් පසු බදු පෙර ශුද්ධ ලාභය රු.මි.67.4 කි. (පොත්වලින් ගැලපූ ප්‍රදාන කොටස රුපියල් මිලියන 115 කි) තවද 2020 වර්ෂයේ ගණනය කරන ලද ණය හානිකරණයේ අගය රු.මි.7.6 කි.

**වගු අංක 6.2.1 : පසුගිය වර්ෂ 05 ක මූල්‍ය සමාලෝචනය**

රු.000

| විස්තරය | 2016 | 2017 | 2018 | 2019 | 2020 |
|---|---|---|---|---|---|
| ආදායම | | | | | |
| පොළී ආදායම | 305,633 | 404,872 | 400,599 | 266,181 | 274,899 |
| භාණ්ඩාගාර ණය පොළී | (127,908) | (138,318) | (137,858) | (134,813) | (131,744) |
| දළ ආදායම | **177,725** | **266,554** | **262,741** | **131,367** | **143,154** |
| | | | | | |
| වෙනත් ආදායම් | 5,177 | 3,526 | 2,221 | 133,929 | 86,101 |
| පරිපාලන වියදම් | (33,932) | (46,531) | (40,393) | (41,073) | (38,151) |
| පළාත් පාලන ආයතන වෙත විශේෂ ප්‍රදාන (Grant Amortization) | (54,773) | **(245,395)** | **(187,976)** | **(153,588)** | **(115,998)** |
| මෙහෙයුම් ලාභය | **94,196** | **(21,846)** | **36,593** | **70,635** | **75,106** |
| | | | | | |
| ණය හානිකරණය සහ අනෙකුත් අලාභයන් | (142,363) | (34,762) | (4,583) | (4,687) | (7,646) |
| මූල්‍ය ආදායම | 52,628 | - | - | - | - |
| බදු ගෙවීමට පෙර ලාභය | **4,461** | **12,916** | **32,008** | **65,948** | **67,460** |
| ආදායම් බදු ගෙවීම් | (892) | (3,168) | (593) | (3,274) | (2,495) |
| බදු ගෙවීමෙන් පසු ලාභය | **3,569** | **16,083** | **32,601** | **69,222** | **69,955** |
| ශුද්ධ ලාභය | 3,569 | **16,083** | **32,601** | **69,222** | **69,955** |
| වර්ෂ ආරම්භයේ රඳවාගත් ඉපැයුම් | (935,525) | 15,814 | 32,803 | 69,385 | 69,122 |
| වර්ෂ අවසානයේ රඳවාගත් ඉපැයුම් | **(931,956)** | **15,814** | **32,803** | **69,385** | **69,122** |


**භාණ්ඩාගාරය වෙත ණය ආපසු ගෙවීම්**


2020 වර්ෂය තුලදී දේශීය අරමුදල් සඳහා ණය වාරික සහ පොළී මුදල් වශයෙන් පිළිවෙලින් රු.මි.20.6 ක් සහ රු.මි.8.8 ක් මහා භාණ්ඩාගාරයට ආපසු ගෙවා ඇත. නාගරික සංවර්ධන සහ අඩු ආදායම් නිවාස ව්‍යාපෘතිය යටතේ රු.මි.87.7 ක් ණය වාරික වශයෙන් ද රු.මි.78.3 ක් පොළී වශයෙන් ද මහා භාණ්ඩාගාරයට ආපසු ගෙවා ඇත. පළාත් පාලන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ රු.මි.121.0 ක් ණය වාරික වශයෙන් ද රු.මි.47.4 ක් පොළී වශයෙන් ද මහා භාණ්ඩාගාරයට ආපසු ගෙවා ඇත. තවද බහු වාර්ෂික භෝග සංවර්ධන ව්‍යාපෘතිය වෙනුවෙන් රු.මි.2.5 ක් ණය වාරික වශයෙන් ද රු.මි.4.0 ක් පොළී වශයෙන් ද ආපසු ගෙවා ඇත.

**වගු අංක 6.2.2 : භාණ්ඩාගාරය වෙත ණය ආපසු ගෙවීමේ ප්‍රගතිය - 2020**

(රු.මි)

| | වාරික ගෙවීම් | පොළී ගෙවීම් | එකතුව |
|---|---|---|---|
| **LLDF** | 20.6 | 8.8 | 29.4 |
| **PCDP** | 2.5 | 4.0 | 6.5 |
| **UDLIHP** | 87.7 | 78.3 | 166.0 |
| **LGIIP** | 121.0 | 47.4 | 168.4 |
| එකතුව | 231.8 | 138.5 | 370.3 |




රූප සටහන 6.2.2 - මහා භාණ්ඩාගාරයට ණය ආපසු ගෙවීමේ ප්‍රගතිය


# දේශීය ණය සහ සංවර්ධන අරමුදල

## වගු අංක 6.2.3 : මහා භාණ්ඩාගාරය වෙත ණය ආපසු ගෙවීම 2016 - 2020

රුපියල් මිලියන

| වර්ෂය | වාරික | | | | පොළිය | | | | මුළු එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|
| | LLDF | PCDP | UDLIHP | LGIIP | LLDF | PCDP | UDLIHP | LGIIP | |
| 2016 | 21.9 | 3.90 | 74.1 | 1.7 | 15.2 | 4.8 | 72.3 | 35.4 | 229.3 |
| 2017 | 21.6 | 4.62 | 74.0 | 16.7 | 13.5 | 1.9 | 68.3 | 36.8 | 237.4 |
| 2018 | 21.3 | 2.13 | 73.6 | 20.6 | 11.9 | 4.4 | 64.1 | 26.3 | 224.3 |
| 2019 | 21.1 | 2.3 | 90.8 | 80.6 | 10.3 | 4.2 | 76.2 | 43.9 | 329.4 |
| 2020 | 20.6 | 2.5 | 87.7 | 121.0 | 8.8 | 4.0 | 78.3 | 47.4 | 370.3 |
| **එකතුව** | 106.5 | 15.45 | 400.2 | 240.6 | 59.7 | 19.3 | 359.2 | 189.8 | 1,390.7 |


LLDF — දේශීය ණය සහ සංවර්ධන අරමුල මගින් නිකුත් කළ ණය
PCDP — බහු වාර්ෂික භෝග සංවර්ධන ව්‍යාපෘතිය මගින් නිකුත් කළ ණය මුදල්
UDLIHP — නාගරික සංවර්ධන සහ අඩු ආදායම් නිවාස ව්‍යාපෘතිය
LGIIP — පළාත් පාලන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය



**වගු අංක 6.2.4 : මහා භාණ්ඩාගාරය වෙත ණය ආපසු ගෙවීම්**
දේශීය ණය සහ සංවර්ධන අරමුදල (LLDF)
**2016 – 2020**

රුපියල් මිලියන

| වර්ෂය | වාරික | පොළිය |
|---|---|---|
| 2016 | 21.9 | 15.2 |
| 2017 | 21.6 | 13.6 |
| 2018 | 21.3 | 11.9 |
| 2019 | 21.1 | 10.3 |
| 2020 | 20.6 | 8.8 |




රූප සටහන 6.2.4 - මහා භාණ්ඩාගාරයට ණය ආපසු ගෙවීම් (LLDF)


වගු අංක 6.2.5 : **මහා භාණ්ඩාගාරය වෙත ණය ආපසු ගෙවීම්**

**2016 – 2020**

බහු වාර්ෂික භෝග සංවර්ධන ව්‍යාපෘතිය (PCDP)

රුපියල් මිලියන

| වර්ෂය | වාරික | පොළිය |
|---|---|---|
| 2016 | 3.90 | 4.8 |
| 2017 | 4.62 | 1.9 |
| 2018 | 2.13 | 4.4 |
| 2019 | 2.33 | 4.2 |
| 2020 | 2.5 | 4.0 |





රූප සටහන 6.2.5 - මහා භාණ්ඩාගාරයට ණය ආපසු ගෙවීම් (PCDP)

**වගු අංක 6.2.6 : මහා භාණ්ඩාගාරය වෙත ණය ආපසු ගෙවීම් 2016 – 2020**

නාගරික සංවර්ධන සහ අඩු ආදායම් නිවාස ව්‍යාපෘතිය **(UDLIHP)**

**රුපියල් මිලියන**

| වර්ෂය | වාරික | පොළිය |
|---|---|---|
| 2016 | 74.1 | 72.3 |
| 2017 | 74.0 | 68.3 |
| 2018 | 73.6 | 64.1 |
| 2019 | 90.8 | 76.2 |
| 2020 | 87.7 | 78.3 |





රූප සටහන 6.2.6 - මහා භාණ්ඩාගාරයට ණය ආපසු ගෙවීම් (UDLIHP)

**වගු අංක 6.2.7 : මහා භාණ්ඩාගාරය වෙත ණය ආපසු ගෙවීම් 2016 – 2020**
**පළාත් පාලන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (LGIIP)**

රුපියල් මිලියන

| වර්ෂය | වාරික ගෙවීම් | පොළී ගෙවීම් |
|---|---|---|
| 2016 | 1.7 | 35.4 |
| 2017 | 16.7 | 36.8 |
| 2018 | 20.6 | 26.3 |
| 2019 | 80.6 | 43.9 |
| 2020 | 121.0 | 47.4 |




රූප සටහන 6.2.7 - මහා භාණ්ඩාගාරයට ණය ආපසු ගෙවීම් (LGIIP)

# 07. විගණන හා කළමනාකරණ කමිටු වාර්තාව - 2020 වර්ෂය

2010.12.14 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ පී.ඊ.ඩී./55 ප්‍රකාර දේශීය ණය සහ සංවර්ධන අරමුදලේ කොමසාරිස් මණ්ඩලය විසින් විගණන හා කළමනාකරණ කමිටුව පත්කර ඇත. විධායක නොවන අධ්‍යක්ෂවරයන් දෙදෙනෙක් සහ අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණක ද ඇතුලත් තිදෙනෙකුගෙන් විගණන කමිටුව සමන්විත වේ. කොමසාරිස් මණ්ඩලය නියෝජනය කරන භාණ්ඩාගාර නියෝජිත, එහි සභාපති ලෙස ද විගණකාධිපති දෙපාර්තමේන්තුවේ නියෝජිත නිරීක්ෂක වශයෙන් ද සහභාගී වේ.

**(01) 2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන**

2019 වර්ෂයේ අවසාන ගිණුම් සමාලෝචනය සහ නිරීක්ෂණය සඳහා ඉදිරිපත් කර ඇත.

**(02)** 2019 වර්ෂයේ සවිස්තරාත්මක **විගණකාධිපති වාර්තාව සමාලෝචනය**

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඇතුලත්ව එහි කටයුතු පිළිබඳව සභාපති වෙත ඉදිරිපත් කරන සවිස්තරාත්මක විගණකාධිපති වාර්තාව සමාලෝචනය කරනු ලැබූ අතර, එමගින් පැන නැගී ඇති කරුණු නිවැරදි කිරීමට ගතයුතු ක්‍රියාමාර්ග සඳහා ආයතනය යොමුකරනු ලැබීය.

(අ) **ආයතනයේ අධ්‍යක්ෂ තනතුර**

2010 වර්ෂයේ සිට මෙම ආයතනයේ අධ්‍යක්ෂ තනතුර සඳහා වැඩ බැලීමේ පත්කිරීම් දිගින් දිගටම සිදුවන බැවින් අධ්‍යක්ෂ තනතුර සඳහා නිත්‍ය නිලධාරියෙකු බඳවාගැනීමට හැකිවන පරිදි මෙම ආයතනයේ බඳවාගැනීමේ පටිපාටිය සංශෝධනය කිරීමට උපදෙස් ලබාදීම.

(ආ) **නීති රීති හා රෙගුලාසි වලට අනුකූල නොවන පරිදි වැඩබලන අධ්‍යක්ෂ/ ප්‍රධාන විධායක නිලධාරී වෙත වැටුප් හා ප්‍රවාහන දීමනා ගෙවීම**

මෙම ආයතනයේ හිටපු වැඩ බලන අධ්‍යක්ෂ වරයෙකු වූ ගණකාධිකාරි සේවයේ නිලධාරියෙකු වන එස්.ඒ.එන්.ආර්.සුභසිංහ මහතා විසින් නීතිරීති හා රෙගුලාසිසි වලට පටහැනිව 2015 – 2016 වර්ෂවල දී ලබා ගෙන ඇති වැටුප් සහ ප්‍රවාහන දීමනාව අය කිරීමට අවශ්‍ය කටයුතු කිරීමට උපදෙස් ලබාදීම.

**(03) 2019 වර්ෂයේ වාර්ෂික වාර්තාව**

2019 වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට අවශ්‍ය මගපෙන්වීම සහ උපදෙස් ලබාදීම.

**(04) ව්‍යවස්ථා, කොන්දේසි, නීතිරීති හා චක්‍ර ලේඛන සමග අනුකූලතාවය**

ඒකාබද්ධ සැලසුම පිළියෙල කිරීම සඳහා උපදෙස් ලබාදුන් අතර 2021 වර්ෂයේ මූල්‍යාමය බලතල මු.රෙ.135 යටතේ පැවරීම සම්බන්ධයෙන් කොමසාරිස් මණ්ඩල අනුමැතිය ලබාගත යුතු බවට උපදෙස් දෙන ලදී.

**(05) පද්ධති සහ පාලන ක්‍රම ඵලදායීතාවය**

අයවැය ලේඛන, පාලන පද්ධතියක් ලෙස ක්‍රියාත්මක කිරීමට පාලන අධිකාරියට උපදෙස් ලබාදෙන ලදී. එමෙන්ම ණය අයකර ගැනීමේ ක්‍රියාවලිය නිරීක්ෂණය කර අදාළ පියවර ගැනීමට ප්‍රධාන විධායක නිලධාරීට උපදෙස් දෙන ලදී.

**(06) අභ්‍යන්තර විගණක තනතුර *(Internal Auditor)***

අමාත්‍යාංශ අභ්‍යන්තර විගණක දැනට අරමුදලේ අභ්‍යන්තර විගණක වශයෙන් කටයුතු කිරීම සඳහා කොමසාරිස් මණ්ඩයේ නිර්දේශ මත පත්කර ඇත. තවද මෙම ආයතනයේ බඳවාගැනීමේ පරිපාටිය සංශෝධනය කිරීමේදී නව අභ්‍යන්තර විගණක තනතුරක් ඇති කිරීම සහ නව බඳවාගැනීමක් සිදු කිරීමේ අවශ්‍යතාවය පිළිබඳව උපදෙස් ලබාදීම.

**(07) හිඟ ණය අයකිරීම**

අක්‍රිය තත්වයේ පවතින ණය මුදල් අයකිරීම සඳහා පළාත් පාලන ආයතන සමග සාකච්ඡාකර එම ආයතන වලට ගෙවීමට හැකි වාරික මුදලකට ණය මුදල ප්‍රතිව්‍යුහගතකර අයකිරීමටත්, පළාත් මට්ටමින් යොමුකර ඒ සඳහා ප්‍රමුඛත්වය ලබාදී සාකච්ඡා කිරීමත් නැතහොත් නීතිමය පියවර ගැනීම සඳහා කොමසාරිස් මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට නිර්දේශ කර ඇත.

**(08) පරිගණක මෘදුකාංග පද්ධතිය**

දේශීය ණය සහ සංවර්ධන අරමුදලේ අරමුණු සහ පරමාර්ථ ඉටුකරගැනීමේදී ඉහළ කළමනාකරණයට වඩාත් නිවැරදි තීරණ ගැනීම සඳහා වඩාත් සත්‍ය වූ නිවැරදි තොරතුරු පද්ධතියක් පවත්වාගෙන යාමේ අවශ්‍යතාව කමිටුව විසින් පෙන්වා දෙන ලදී. ඒ අනුව දැනට පවතින පද්ධතියේ වත්මන් ප්‍රගතිය සම්බන්ධයෙන් වාර්තා කරන ලෙස උපදෙස් ලබාදීම.

**(09) විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කරන ලද විගණන විමසුම් - 2019/2020**

විගණන විමසුම් මගින් පෙන්වා දී ඇති කරුණු පිළිබඳව සාකච්ඡාකර අදාළ නිවැරදි කිරීම් සිදුකිරීමට අවශ්‍ය උපදෙස් ලබාදීම.

## (10) තිරසාර සංවර්ධන ඉලක්ක

තිරසාර සංවර්ධන පනත මගින් ප්‍රධාන අරමුණු 17 ක් හඳුනාගෙන ඇති බවත්, ඒවායින් ආයතනයට වඩා වාසිදායක අරමුණු හඳුනාගෙන එම අරමුණු වලට ලඟාවීම සඳහා ආයතනයේ මුළු සේවක සංඛ්‍යාව සඳහා KPI සකස් කර, අදාළ ඇගයීමේ ක්‍රමවේදය සකස් විය යුතු බව පෙන්වා දීම.

## 2020 වර්ෂයේ කමිටු සාමාජිකයින්

| | | |
|---|---|---|
| එම්.ඒ.එම්.අන්ෆාස් මහතා | භාණ්ඩාගාර නියෝජනය | සභාපති |
| ජේ.එම්.සී.ජයන්ති විජේතුංග මහත්මිය | ප්‍රධාන ලේකම්, බස්නාහිර පළාත | සාමාජික |
| ඒ.ඩී.කේ.ගුරුගේ මහතා | ගරු අමාත්‍යතුමා විසින් පත්කරන ලද කොමසාරිස් මණ්ඩල සාමාජික | සාමාජික |
| ඒ. ධනපාල මහතා | විගණකාධිපති දෙපාර්තමේන්තුව | නිරීක්ෂක |
| නිරංගා ප්‍රේමතිලක මහත්මිය | ප්‍රධාන අභ්‍යන්තර විගණක (මුදල් අමාත්‍යාංශය) | කැඳවුම්කරු |

# මූල්‍ය ප්‍රකාශ හා තොරතුරු

# ජාතික විගණන කාර්යාලය
# தேசிய கணக்காய்வு அலுவலகம்
# NATIONAL AUDIT OFFICE

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | ඩබ්ලිව්එන්පී2/සීබී/එච්/<br>එල්එල්ඩීඑෆ්/එෆ්ඒ /2020 | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 2021 ජුලි 07 දින |

සභාපති,

දේශීය ණය සහ සංවර්ධන අරමුදල.

**දේශීය ණය සහ සංවර්ධන අරමුදලේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

-----

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

පිටපත :- ලේකම් - මුදල් අමාත්‍යාංශය

No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

# ජාතික විගණන කාර්යාලය
## தேசிய கணக்காய்வு அலுவலகம்
## NATIONAL AUDIT OFFICE

මගේ අංකය
எனது இல.
My No. } ඩබ්ලිව්එෆ්පී2/සීඩී/එච්/
එල්එල්ඩීඑෆ්/එෆ්ඒ /2020

ඔබේ අංකය
உமது இல.
Your No. }

දිනය
திகதி
Date } 2021 ජූලි ෦7 දින

19 JUL 2021

සභාපති,

දේශීය ණය සහ සංවර්ධන අරමුදල.

**දේශීය ණය සහ සංවර්ධන අරමුදලේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍යප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

### 1. මූල්‍ය ප්‍රකාශන

#### 1.1 මතය

දේශීය ණය සහ සංවර්ධන අරමුදලේ 2020 දෙසැම්බර් 31දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

අරමුදලේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

#### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව | இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை | No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

වගකීම් යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන දේශීය ණය සහ සංවර්ධන අරමුදලේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මාගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

15 JUL 2021

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මාගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මාගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මාගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවා ද යන්න සලකා බැලීමයි.

අරමුදලේ 2020 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තවදුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

### 1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීම ද කළමනාකරණයේ වගකීමකි.

2

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබා දීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුව ද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිත කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේ ද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය

තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුව ද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළ දී හඳුනාගත් වැදගත් විගණන සොයා ගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

## 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා අරමුදල පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) (iii)වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) (iv)වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවිය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට අරමුදල සම්බන්ධව යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ **12(ඊ)** වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධිවිධාන අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ **12(උ)** වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ **12(ඌ)** වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත නිරීක්ෂණ හැර අරමුදලේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

(අ) 2020 වර්ෂයේදී අරමුදල විසින් පළාත් පාලන ආයතනවල විවිධ ව්‍යාපෘති 15ක් සඳහා එකතු වටිනාකම රු.268,627,600ක ණය මුදලක් ලබා දීම සඳහා අනුමත කර තිබුණ ද ඉන් එකතු වටිනාකම රු.37,600,000ක් වූ ව්‍යාපෘති 2ක් සඳහා පමණක් ගෙවීම් ආරම්භ කර තිබූ අතර වර්ෂය අවසන් වන විට ඉන් රු.20,780,000ක් එනම් සියයට 55.26ක් පමණක් ගෙවා තිබුණි.

(ආ) 2014 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා අරමුදල විසින් විවිධ ව්‍යාපෘති 139ක් සඳහා ණය අනුමත කර තිබුණ ද ඉන් ව්‍යාපෘති **48**ක් පළාත් පාලන ආයතන විසින් ප්‍රතික්ෂේප කර තිබුණි.

(ඇ) 2019 වර්ෂයේදී එකතු වටිනාකම රු.1,916,490,000ක් වූ ණය ව්‍යාපෘති 33ක් අනුමත කර තිබුණ ද එම ව්‍යාපෘතිවලින් එකතු වටිනාකම රු.991,690,000ක් වූ ණය ව්‍යාපෘති 19ක්, එනම් සියයට 57ක් 2020 වර්ෂයේ අවලංගුකර තිබූ බැවින් ණය අනුමත කිරීමේ ක්‍රියාවලිය නැවත සමාලෝචනය කර සංශෝධනය කළ යුතු බව නිරීක්ෂණය විය.

(ඇ) 2020 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘති 16ක එකතු වටිනාකම රු.272,715,503ක් වූ ණය, ක්‍රියාකාරී නොවන ණය ලෙස දක්වා තිබූ අතර එම ණය නොගෙවා සිටීමේ කාලය වර්ෂ 3 ½ සිට වර්ෂ 22 අතර කාල පරාසයක් ගෙන තිබුණි. සමාලෝචිත වර්ෂයට පෙර වර්ෂයේ පැවති ක්‍රියාකාරී නොවන ණය ශේෂවල එකතු වටිනාකම වූ රු.419,177,427ට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ අක්‍රිය ණය වටිනාකම පහත ගොස් තිබුණ ද ක්‍රියාකාරී නොවන ණය සක්‍රිය කර ගැනීමට ගෙන ඇති ක්‍රියාමාර්ග ප්‍රමාණවත් නොවිය.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති

13 JUL 2021

5

# දේශීය ණය සහ සංවර්ධන අරමුදල
## විස්තීරණ ආදායම් ප්‍රකාශනය
2020 දෙසැම්බර් 31 අවසන් වසර සඳහා

| | සටහන් | 2020<br>රු | 2019<br>රු |
|---|---|---|---|
| පොලී ආදායම | 4 | 274,899,048 | 266,181,649 |
| පොලී වියදම | 5 | 131,744,730 | 134,813,672 |
| **ශුද්ධ පොලී ආදායම** | | **143,154,319** | **131,367,977** |
| වෙනත් මෙහෙයුම් ආදායම් | 6 | 86,101,946 | 133,929,246 |
| **මුළු මෙහෙයුම් ආදායම** | | **229,256,264** | **265,297,223** |
| අපහායන ගාස්තු | 13 | 7,646,096 | 4,687,918 |
| **ශුද්ධ මෙහෙයුම් ආදායම** | | **221,610,168** | **260,609,304** |
| පුද්ගලික වියදම් | 7 | 26,614,719 | 25,997,958 |
| ක්ෂය දේ.පි.උ | 14 | 1,485,164 | 2,999,786 |
| ප්‍රදාන ක්‍රමක්ෂයකිරීම් | 8 | 115,998,584 | 153,588,013 |
| වෙනත් මෙහෙයුම් වියදම් | 9 | 10,051,521 | 12,075,288 |
| **බදු වලට පෙර මෙහෙයුම් ලාභය** | | **67,460,179** | **65,948,259** |
| බදු වියදම් | 10 | (2,495,352) | (3,274,354) |
| **වර්ෂය සඳහා ලාභය** | | **69,955,531** | **69,222,613** |
| **වෙනත් විස්තීර්ණ ආදායම්** | | | |
| සැලසුම්ගත ප්‍රතිලාභ සැලසුම මත සත්‍ය හානිය | 18 | (832,666) | (163,173) |
| **මුළු විස්තීර්ණ ආදායම** | | **69,122,865** | **69,385,786** |

# දේශීය ණය සහ සංවර්ධන අරමුදල
# මූල්‍ය තත්ව ප්‍රකාශය

2020 දෙසැම්බර් 31 අවසන් වසර සඳහා

| | සටහන් | 2020<br>රු | 2019<br>රු |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| මුදල් සහ මුදල් සමාන දෑ | 11 | 172,730,801 | 128,859,193 |
| බැංකු ශේෂය | 12 | 998,000,000 | 1,068,000,000 |
| ණය සහ ලැබිය යුතු දෑ | 13 | 3,418,230,960 | 3,424,739,146 |
| දේපල පිරියත සහ උපකරණ | 14 | 2,793,524 | 4,566,271 |
| විලම්බිත බදු වත්කම් | 17.1 | 9,543,736 | 7,048,384 |
| වෙනත් වත්කම් | 15 | 206,139,809 | 375,839,910 |
| **මුළු වත්කම්** | | **4,807,438,829** | **5,009,052,905** |
| **හිමිකම් සහ වගකීම්** | | | |
| **වගකීම්** | | | |
| පොලී සහිත ණය ගැනීම් සහ භාණ්ඩාගාරයට ගෙවිය යුතු දෑ | 16 | 4,846,265,690 | 5,084,930,312 |
| වර්තමාන බදු වගකීම | 17 | - | - |
| විලම්බිත බදු වගකීම | 17.1 | - | - |
| පශ්චාත් සේවා නියුක්ති ප්‍රතිලාභ වගකීම | 18 | 3,205,473 | 3,561,733 |
| වෙනත් වගකීම් | 19 | 61,164,460 | 96,579,645 |
| **මුළු වගකීම්** | | **4,912,635,622** | **5,185,071,690** |
| **හිමිකම්** | | | |
| රඳවාගත් ඉපයුම් | | (105,196,793) | (176,018,785) |
| **මුළු වගකීම් හිමිකම්** | | **4,807,438,829** | **5,009,052,905** |

මෙකී මූල්‍ය ප්‍රකාශනයන් ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රතිපත්ති වලට අනුකූලව පිළියෙල කර ඇති අතර එමගින් 2020 දෙසැම්බර් 31 දිනට දේශීය ණය සහ සංවර්ධන අරමුදලේ සැබෑ කටයුතු පිළිබඳ සාධාරණ සහ සත්‍ය තත්වය සහ එහි අවසන් වූ කාල පරිච්ඡේදයෙහි අතිරික්තය පිළිබිඹු කරන බවට සහතික කෙරේ.

එස්.එම්.ඩී.බී.සමරකෝන්
ප්‍රධාන විධායක නිලධාරී (වැ.බ)

කේ.ඒ.ඩී.කහඳවල
නියෝජ්‍ය අධ්‍යක්ෂ (මූල්‍ය සහ පරිපාලන)

මෙකී මූල්‍ය ප්‍රකාශයන් පිළියෙල කර ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් කොමසාරිස් මණ්ඩලය වගකීමට බැඳේ. කොමසාරිස් මණ්ඩලය වෙනුවෙන් අත්සන් කළා;

ආර්.එම්.පී.රත්නායක
සභාපති

එම්.ඒ.එම්.අන්ෆාස්
භාණ්ඩාගාර නියෝජිත

2021 පෙබරවාරි 25
කොළඹ

# දේශීය ණය සහ සංවර්ධන අරමුදල
# මුදල් ප්‍රවාහ ප්‍රකාශය

2020 දෙසැම්බර් 31 අවසන් වසර සඳහා

| | සටහන් | 2020<br>රු | 2019<br>රු |
|---|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරීත්වය මගින් වන මුදල් ප්‍රවාහය** | | | |
| බදු වලට පෙර ලාභය | | **67,460,179** | **65,948,259** |
| **ගැලපුම් කිරීම්** | | | |
| ක්ෂය සහ ක්‍රමක්ෂය | | 117,483,748 | 156,587,800 |
| අපහායන ගාස්තු | | 7,646,096 | 4,687,918 |
| ප්‍රදාන ක්‍රමක්ෂය ආදායම් | | - | - |
| වෙනත් ආදායම් | | - | - |
| පාරිතෝෂික සහ උපචිත වියදම් | | 1,231,900 | 976,527 |
| පොලී වියදම් | | 131,744,730 | 134,813,672 |
| **කාරක ප්‍රාග්ධන වෙනසට පෙර මෙහෙයුම් ලාභය** | | **325,566.654** | **363,014,175** |
| වෙනත් වත්කම් (වැඩිවීම)/අඩුවීම | | 169,700,101 | 210,946,786 |
| වෙනත් වගකීම් (වැඩිවීම)/අඩුවීම | | (157,744,104) | (252,498,826) |
| **මෙහෙයුම් මගින් උපදවන ලද මුදල්** | | **337,522,651** | **321,462,135** |
| ඉදිරියට ගෙනා ශුද්ධ ණය ගැතියන් | | 5,440,138 | (125,340,694) |
| ගෙවූ බදු | | - | - |
| ගෙවූ පාරිතෝෂික | | - | - |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් මගින් උපදවන ලද/(භාවිතා කරන ලද) ශුද්ධ මුදල්** | | **342,962,789** | **196,121,441** |
| **ආයෝජන ක්‍රියාකාරකම් මගින් ලද මුදල් ප්‍රවාහ** | | | |
| මිලදී ගැනීම් දේපල පිරියත සහ උපකරණ | | - | (567,211) |
| දේ.පි.සහ උ විකිණීම මගින් ඉදිරියට ගෙනා | | - | - |
| අසපෘෂ්‍ය වත්කම් ශුද්ධ මිලදී ගැනීම් | | - | (69,554) |
| ශුද්ධ ආයෝජන | | 80,988,196 | 197,581,620 |
| ලැබුණ ආයෝජන ආදායම් | | (9,670,024) | (33,288,195) |
| **ආයෝජන ක්‍රියාකාරකම් මගින් උපදවන ලද/(භාවිතා කරන ලද) ශුද්ධ මුදල්** | | **71,318,172** | **163,656,660** |
| **මූල්‍ය ක්‍රියාකාරකම් මගින් ලද මුදල් ප්‍රවාහ** | | | |
| ගෙවන ලද පොලී වියදම් | | | |
| ශුද්ධ ණය ගැනීම් | | (370,409,352) | (296,855,759) |
| **මූල්‍ය ක්‍රියාකාරකම් මගින් උපදවන ලද/(භාවිතා කරන ලද) ශුද්ධ මුදල්** | | (370,409,352) | (296,855,759) |
| **මුදල් සහ මුදල් සමාන දෑ හි ශුද්ධ වැඩිවීම/(අඩුවීම)** | | **43,871,609** | **(62,922,343)** |
| වර්ෂය ආරම්භයේ මුදල් සහ මුදල් සමාන දෑ | | 128,859,193 | 65,936,851 |
| **වර්ෂාවසාන මුදල් සහ මුදල් සමාන දෑ** | | **172,730,801** | **128,859,193** |
| බැංකු අයිරා ශේෂය | 11 | 172,730,801 | 128,859,193 |
| | | **172,730,801** | **128,859,193** |

# දේශීය ණය සහ සංවර්ධන අරමුදල
# හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය

2020 දෙසැම්බර් 31 අවසන් වසර සඳහා

| | රඳවාගත් ඉපයුම් රු | මුළු හිමිකම් රු |
|---|---|---|
| **2019 ජනවාරි 01 දිනට ශේෂය (නැවත ප්‍රකාශිත*)** | (243,042,602) | (243,042,602) |
| රඳවාගත් ඉපයුම් සඳහා ගැලපුම් | (2,361,969) | (2,361,969) |
| වසරේ ලාභය | 69,222,613 | 69,222,613 |
| Other comprehensive income (net of tax) | 163,173 | 163,173 |
| **2019 දෙසැම්බර් 31 දිනට ශේෂය** | (176,018,785) | (176,018,785) |
| **2020 ජනවාරි 01 දිනට** | (176,018,785) | (176,018,785) |
| රඳවාගත් ඉපයුම් සඳහා ගැලපුම් | 33,795 | 33,795 |
| වසරේ ලාභය | 69,955,531 | 69,955,531 |
| වෙනත් විස්තීර්ණ ආදායම් (ශුද්ධ බදු) | 832,666 | 832,666 |
| **2020 දෙසැම්බර් 31 දිනට ශේෂය** | (105,196,793) | (105,196,793) |

# දේශීය ණය සහ සංවර්ධන අරමුදල
# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්
2020 දෙසැම්බර් 31 අවසන් වසර සඳහා

**4 පොලී ආදායම්**

| | 2020 | 2019 |
|---|---|---|
| | රු | රු |
| ණය සහ අත්තිකාරම් වෙතින් පොලිය | 274,899,048 | 266,181,649 |
| | 274,899,048 | 266,181,649 |

**5 පොලී වියදම්**

| | 2020 | 2019 |
|---|---|---|
| | රු | රු |
| භාණ්ඩාගාර ණය ගැනීම් සඳහා පොලී වියදම් | **131,744,730** | **134,813,672** |

**6 වෙනත් මෙහෙයුම් ආදායම්**

| | 2020 | 2019 |
|---|---|---|
| | රු | රු |
| ආයෝජන ආදායම | 82,866,162 | 130,673,892 |
| සේවක ණය පොලී | 872,360 | 1,035,535 |
| දඩ ආදායම් (බෙරුම්කරන ලද හානි) සහ වෙනත් | 2,363,423 | 2,219,818 |
| | 86,101,946 | 133,929,246 |

**7 පුද්ගලික වියදම්**

| | 2020 | 2019 |
|---|---|---|
| | රු | රු |
| වැටුප් සහ අනෙක් ප්‍රතිලාභ | 22,890,317 | 22,570,577 |
| සේ.අ.අ. සහ සේ.නි.භා. අ | 2,913,329 | 2,747,069 |
| පාරිතෝෂික වියදම් | 811,074 | 680,312 |
| | **26,614,719** | **25,997,958** |

**8 ප්‍රදාන ක්‍රමක්ෂය කිරීම්-LGIIP**

| | 2020 | 2019 |
|---|---|---|
| | රු | රු |
| ණය ප්‍රදාන | 159,544,271 | 211,244,714 |
| අඩු කළා: ණය ප්‍රදාන | 43,545,687 | 57,656,701 |
| ශුද්ධ ප්‍රදාන ක්‍රමක්ෂය කිරීම් | **115,998,584** | **153,588,013** |

**9 වෙනත් මෙහෙයුම් වියදම්**

| | 2020 | 2019 |
|---|---|---|
| | රු | රු |
| කාර්යාල පරිපාලන සහ ආයතන වියදම් | 9,976,953 | 11,567,238 |
| වෘත්තීය සහ නෛතික වියදම් | 74,568 | 508,050 |
| විගණක පාරිශ්‍රමිකයන් | - | - |
| | **10,051,521** | **12,075,288** |

# දේශීය ණය සහ සංවර්ධන අරමුදල
## මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්
2020 දෙසැම්බර් 31 අවසන් වසර සඳහා

| | | 2020 | 2019 |
|---|---|---|---|
| **10** | බදු වියදම් | රු | රු |
| | වර්තමාන බදු ප්‍රතිපාදන | - | - |
| | වර්තමාන බදු සඳහා අව ප්‍රතිපාදන / (අධි ප්‍රතිපාදන) | - | - |
| | විලම්බිත බදු වියදම්/(ආදායම) | 2,495,352 | 3,274,354 |
| | | 2,495,352 | 3,274,354 |
| **10.1** | බදු වලට පෙර ගිණුම්කරන ලාභ/(අලාභ) | 67,460,179 | 65,948,259 |
| | එකතුකරන ලද අවසර නොදුන් අයිතම | 9,942,334 | 8,368,017 |
| | එකතුකරනලද අවසර දෙන ලද අයිතම | (1,364,548) | (3,340,595) |
| | ව්‍යාපාරයේ ගැලපුම් කරන ලද ලාභ | 76,037,966 | 70,975,680 |
| | පොලී ආදායම් | (82,866,162) | (130,673,892) |
| | මුළු ව්‍යවස්ථාපිත ආදායම | (6,828,196) | (59,698,212) |
| | අඩු කළා -අවසර ලත් හානි | - | - |
| | බදු අයකල හැකි ආදායම | (6,828,196) | (59,698,212) |
| **10.2** | ව්‍යවස්ථාපිත බදු අනුපාතය | | |
| | වර්තමාන ආදායම් බදු වියදම | - | - |

(කාලපරිච්ඡේදය සඳහා බදු වගකීම සහ අනුපාතය - 10%)

# දේශීය ණය සහ සංවර්ධන අරමුදල
# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

2020 දෙසැම්බර් 31 අවසන් වසර සඳහා

| | | 2020 | 2019 |
|---|---|---|---|
| | | රු | රු |
| 11 | **මුදල් සහ මුදල් සමාන දෑ** | | |
| | බැංකුවල ඇති ඉතුරුම් තැන්පතු | 112,382,234 | 9,830,363 |
| | බැංකුවල ඇති ජංගම තැන්පතු | 60,348,568 | 60,528,830 |
| | ආපසු යැවූ මිලදී ගැනීම් | - | 58,500,000 |
| | | **172,730,801** | **128,859,193** |

| | | 2020 | 2019 |
|---|---|---|---|
| 12 | **බැංකු ශේෂය** | රු | රු |
| | බැංකුවල ඇති ස්ථාවර තැන්පතු | 988,000,000 | 1,068,000,000 |
| | | 988,000,000 | 1,068,000,000 |

| | | 2020 | 2019 |
|---|---|---|---|
| 13 | **ණය සහ ලැබිය යුතු දෑ** | | |
| | | රු | රු |
| | ලැබිය යුතු ණය (සටහන 13.1) | 4,323,322,136 | 4,322,184,226 |
| | අඩුකළා : අපහායන සඳහා දීමනා (සටහන 13.2) | 905,091,176 | 897,445,080 |
| | | **3,418,230,960** | **3,424,739,146** |

**13.1 විශ්ලේෂණය - (ව්‍යාපෘති මගින්)**

| | 2020 | 2019 |
|---|---|---|
| දේශීය ණය සහ සංවර්ධන අරමුදල | 1,928,829,985 | 1,642,681,783 |
| LGIIP | 696,755,931 | 882,061,984 |
| PCDP | 81,299,732 | 83,872,634 |
| UDLIHP | 1,590,088,617 | 1,687,927,207 |
| NWSDB | 5,752,255 | 6,233,130 |
| කාර්යමණ්ඩල ණය | 20,595,616 | 19,407,488 |
| | **4,323,322,136** | **4,322,184,226** |

**13.2 වසර තුළ අපහායන ගාස්තු චලනය**

| | 2020 | 2019 |
|---|---|---|
| ජනවාරි 1 දිනට | 897,445,080 | 892,757,162 |
| වසර තුළ කපා හරින ලද | | |
| වසර සඳහා ගාස්තු | 7,646,096 | 4,687,918 |
| දෙසැම්බර් 31 දිනට | **905,091,176** | **897,445,080** |

# දේශීය ණය සහ සංවර්ධන අරමුදල
# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්
2020 දෙසැම්බර් 31 අවසන් වසර සඳහා

## 14 දේපල පිරියත සහ උපකරණ

**පිරිවැය**

| ක්ෂය | 2020.01.01 දිනට පිරිවැය | එකතු කිරීම් | අපහරණ/මාරු | 2020.12.31 දිනට පිරිවැය |
|---|---|---|---|---|
| කාර්යාල උපකරණ | 1,725,753 | - | - | 1,725,753 |
| ලී බඩු සහ උපකරණ | 1,748,813 | - | - | 1,748,813 |
| පරිගණක මෘදුකාංග සහ දෘඩාංග | 10,091,398 | - | - | 10,091,398 |
| මෝටර් වාහන | 7,995,000 | - | - | 7,995,000 |
| **එකතුව** | **21,560,964** | **-** | **-** | **21,560,964** |

**සමුච්චිත ක්ෂය**

| විස්තරය | 2020.01.01 දිනට ශේෂය | වසර සඳහා ක්ෂය කිරීම් | අපහරණ/මාරු | 2020.12.31 දිනට ශේෂය |
|---|---|---|---|---|
| කාර්යාල උපකරණ | 919,058 | 244,961 | - | 1,164,019 |
| ලී බඩු සහ උපකරණ | 852,678 | 146,829 | - | 999,507 |
| පරිගණක මෘදුකාංග සහ දෘඩාංග | 7,515,540 | 1,093,375 | - | 8,608,914 |
| මෝටර් වාහන | 7,995,000 | - | - | 7,995,000 |
| **එකතුව** | **16,994,693** | **1,485,164** | **-** | **18,767,441** |
| | | | | |
| ලියා හල අගය | 4,566,271 | | | **2,793,524** |

# දේශීය ණය සහ සංවර්ධන අරමුදල
# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්
2020 දෙසැම්බර් 31 අවසන් වසර සඳහා

| | | 2020 | 2019 |
|---|---|---|---|
| **15** | **වෙනත් වත්කම්** | රු | රු |
| | ලැබිය යුතු ඇවර කරන ලද හානි | 1,480,731 | 1,480,731 |
| | පළාත් පාලන අධිකාරී වෙත LGIIP ප්‍රදාන | 144,289,463 | 303,833,734 |
| | බඩු වට්ටෝරු | 114,082 | 108,042 |
| | වෙනත් ලැබිය යුතු දෑ | 60,255,533 | 70,417,403 |
| | | **206,139,809** | **375,839,910** |

| | | 2020 | 2019 |
|---|---|---|---|
| **16** | **පොලී සහිත ණය ගැනීම් සහ භාණ්ඩාගාරයට ගෙවිය යුතු දෑ** | රු | රු |
| | දේ.ණ.සහ සං. අ | 108,580,057 | 129,161,689 |
| | LGIIP | 3,285,594,291 | 3,406,611,719 |
| | PCDP | 48,647,314 | 51,204,216 |
| | UDLIHP | 1,403,444,028 | 1,497,952,688 |
| | | **4,846,265,690** | **5,084,930,312** |

| | | 2020 | 2019 |
|---|---|---|---|
| **17** | **වර්තමාන බදු වගකීම්** | | |
| | | රු | රු |
| | වසර මුල ශේෂය | **(10,461,178)** | **(16,691,149)** |
| | එකතු කළා : වර්තමාන වසර සඳහා ප්‍රතිපාදන/ප්‍රතිපාදන යටතේ ගැලපුම් | - | - |
| | අඩු කළා: වසර තුළ ගෙවීම් | - | - |
| | රඳවාගත් බදු | 6,807 | 6,229,971 |
| | | **(10,454,370)** | **(10,461,178)** |

| | | 2020 | 2019 |
|---|---|---|---|
| **17.1** | **විලම්බිත බදු වගකීම් / (වගකීම්)** | | |
| | | රු | රු |
| | විලම්බිත බදු වත්කම් | 7,684,904 | 117,215 |
| | විලම්බිත බදු වගකීම් | 1,858,832 | (7,165,599) |
| | | **9,543,736** | **(7,048,384)** |

| | | 2020 | 2019 |
|---|---|---|---|
| **18** | **පශ්චාත් සේවා නියුක්ති ප්‍රතිලාභ වගකීම** | | |
| | | රු | රු |
| | ජනවාරි 1 දිනට | 3,561,733 | 3,044,594 |
| | ආදායම් ප්‍රකාශයෙහි හඳුනාගත් ප්‍රමාණය | 811,074 | 680,312 |
| | විස්තීර්ණ ආදායම් යටතේ හඳුනාගත් ප්‍රමාණය | 832,666 | (163,173) |
| | වසර තුළ කරන ලද ගෙවීම් | - | - |
| | දෙසැම්බර් 31 දිනට | **5,205,473** | **3,561,733** |

# දේශීය ණය සහ සංවර්ධන අරමුදල
## මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්
2020 දෙසැම්බර් 31 අවසන් වසර සඳහා

**18.1 ආදායම් ප්‍රකාශයෙහි හඳුනා ගන්නා ලද ප්‍රමාණය**

| | 2020 | 2019 |
|---|---|---|
| වර්තමාන සේවා පිරිවැය | 437,092 | 314,961 |
| පොලී පිරිවැය | 373,982 | 365,351 |
| | 811,074 | 680,312 |

**18.2 පාරිතෝෂික වගකීම ගණනය කිරීම පිණිස භාවිතා කරනා මූලික උපකල්පනයන් පහත පරිදි වේ:**

| | 2020 | 2019 |
|---|---|---|
| පොලී අනුපාතය | 7.6% | 12% |
| වැටුප් වර්ධක අනුපාතය | Fixed increment per annum | Fixed increment per annum |
| කාර්ය මණ්ඩල පිරිවැටුම | 5.3% | 10% |
| විශ්‍රාමික වයස | 60 years | 60 years |

**18.3 ගණනය කිරීමේදී යොදා ගන්නා උපකල්පනයන්ගේ සංවේදීතාව**

2020 දෙසැම්බර් 31 දිනට වැදගත් උපකල්පන සඳහා වන ප්‍රමාණාත්මක සංවේදී විශ්ලේෂණය පහත පරිදි වේ.

| **උපකල්පන** | **වට්ටම් අනුපාතය** | |
|---|---|---|
| **සංවේදී මට්ටම** | **1% වැඩිවීම** | **1% අඩුවීම** |
| නිර්වචනය කරන ලද වගකීම මත වන බලපෑම | 4,885,951 | 5,566,253 |

| | 2020 | 2019 |
|---|---|---|
| **19 වෙනත් වගකීම්** | රු | රු |
| ශ්‍රී ලංකා රජයේ ප්‍රදාන | 39,832,071 | 82,927,758 |
| දේ.ණ.සහ සං.අ ප්‍රාග්ධන ප්‍රදාන | 5,314,508 | 5,314,508 |
| ගෙවිය යුතු විලම්බිත බදු | - | - |
| කලින් ගෙවූ ණයගැතියෝ සහ අත්තිකාරම් | 15,817,931 | 7,176,040 |
| වෙනත් ගෙවිය යුතු | 649,949 | 1,161,338 |
| | **61,164,460** | **96,579,645** |

# දේශීය ණය සහ සංවර්ධන අරමුදල

## මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

2020 දෙසැම්බර් 31 අවසන් වසර සඳහා

| **20.වියදම් බණ්ඩනය** | **2020** | **2019** |
|---|---|---|
| | රු | රු |
| **පුද්ගල වියදම්** | | |
| කාර්ය මණ්ඩල වැටුප් | 16,189,727 | 14,932,503 |
| ගැලපුම් දීමනා | - | 133,213 |
| ජීවන වියදම් දීමනාව- දේ.ණ.සහ සං. අ | 3,432,000 | 3,504,280 |
| කාර්ය මණ්ඩලය සඳහා ප්‍රසාද දීමනා | 536,250 | 550,000 |
| සභාපති හට දීමනා | 692,135 | 412,500 |
| කොමසාරිස්වරුන් ගේ දීමනා | 441,600 | 556,800 |
| අතිකාල සහ නිවාඩු දින වැටුප් | 90,021 | 85,856 |
| සංවර්ධන සහකාර- ගමන් වියදම් | 327,065 | 890,505 |
| සංවර්ධන නිලධාරී සඳහා දීමනා | 57,600 | 59,700 |
| ගමන් වියදම් - කාර්යාල කාර්ය මණ්ඩලය | 60,895 | 293,550 |
| සේවක අර්ථසාධක අරමුදල | 2,330,663 | 2,197,655 |
| සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල | 582,666 | 549,414 |
| කාර්ය මණ්ඩල සෞඛ්‍ය රක්ෂණය | 1,063,025 | 1,151,670 |
| පාරිතෝෂික වියදම් | 811,074 | 680,312 |
| | **26,614,719** | **25,997,958** |

| | 2020 | 2019 |
|---|---|---|
| **වෙනත් මෙහෙයුම් වියදම්** | රු | රු |
| කාර්ය මණ්ඩල සුභසාධන | 186,063 | 261,364 |
| රැස්වීම් සඳහා වියදම් | 98,615 | 124,819 |
| විගණන වියදම් | - | - |
| තැපැල් දුරකථන සහ අන්තර්ජාල පහසුකම් | 494,274 | 568,832 |
| ලිපිද්‍රව්‍ය/මුද්‍රණ | 205,401 | 411,496 |
| වාහන නඩත්තුව | 307,310 | 334,315 |
| ඉන්ධන | 332,904 | 159,476 |
| වාහන රක්ෂණ | 74,399 | 83,398 |
| විදුලිය | 492,347 | 909,569 |
| ආරක්ෂක ගාස්තු | 1,007,677 | 1,089,725 |
| ජල සැපයුම | 27,348 | 68,684 |
| පවිත්‍රතා සේවා ගාස්තු | 216,000 | 359,288 |
| නඩත්තු සහ උපකරණ | 54,900 | 119,251 |
| නඩත්තු සහ ගොඩනැගිලි | 4,850 | 29,652 |
| කාර්ය මණ්ඩල පුහුණු සහ සංවර්ධන | 87,500 | 362,826 |
| පරිගණක නඩත්තුව | 832,629 | 144,547 |
| බදු සහ වරිපනම් | - | - |
| කාර්යාල කුලී | 5,280,000 | 5,080,000 |
| දැනුවත් කිරීමේ වැඩසටහන් | - | - |
| වෘත්තීය ගාස්තු | 30,000 | 123,000 |
| පුවත් නිවේදන | 165,511 | 1,334,963 |
| නෛතික වියදම් | 44,568 | 385,050 |
| මුද්දර ගාස්තු | 225 | 300 |
| බැංකු ගාස්තු | 10,500 | 1,500 |
| වෙනත් වියදම් | 98,500 | 123,233 |
| | **10,051,521** | **12,075,288** |

# දේශීය ණය සහ සංවර්ධන අරමුදල
## මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්
2020 දෙසැම්බර් 31 අවසන් වසර සඳහා

**21 බැඳීම් සහ අවිනිශ්චිතතා**

අරමුදලේ උපරිම දැනුම සහ ඊට ඇති තොරතුරු අනුව වාර්තාකරණ දිනයට අරමුදලට වැදගත් බැඳීම් සහ අවිනිශ්චිතතා කිසිවක් නැත.

**21.1** පහත දැක්වෙනුයේ 2020 දෙසැම්බර් 31 දිනට විසඳා නොමැති අරමුදලට එරෙහිව ඇති නෛතික ඉල්ලීමය. ඒවායේ අවසන් ප්‍රතිපල පිලිබඳව ඇති අවිනිශ්චිතතා හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනයන්ට ගැලපුම් කර නැත. සාධාරණ ඇස්තමේන්තු සහ ප්‍රතිඵලයේ නිශ්චිතතාව පිලිබඳව ලබා දෙනු ලබන වෘත්තික උපදෙස් මත නෛතික හිමිකම් සම්බන්ධයෙන් වන අහිතකර බලපෑම් උදෙසා, අවශ්‍ය වන්නේ නම් මූල්‍ය ප්‍රකාශනයන්ට තවදුරටත් ගැලපුම් කරනු ලැබේ.

(i) අරමුදලේ හිටපු සේවකයකු විසින් කම්කරු විනිශ්චය සභා නඩුවක් ලෙස අංක 64/7455/2015 යටතේ රත්නපුර කම්කරු උසාවියෙහි නඩුවක් පවරා ඇති අතර ඒ විභාගය සඳහා 2021 මාර්තු 01 ට දින නියම කර ඇත.

**22 වාර්තාකරණ දිනයට පසුව හටගත් සිදුවීම්**

ශේෂ පත්‍ර දිනය සහ ගිණුම් අත්සන් තබන ලද දිනය අතර කිසිදු සිද්ධියක් හටගෙන නොමැති අතර කිසිදු භෞතික ගැටළුවක් හටගෙන නොමැත. මූල්‍ය ප්‍රකාශයෙහි අනාවරණය කල යුතු වන්නාවූ හෝ ගැලපුම් කල යුතු වන්නාවූ කිසිදු සිදුවීමක් නැත.

**23 වැදගත් අදාල පාර්ශව**

වැදගත් අදාල පාර්ශව පිලිබඳ අනාවරණ විස්තර පහත පරිදි වේ;

**23.1 ප්‍රධාන කළමණාකරණ පුද්ගලයන් සමග ගනුදෙනු**

ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිති අංක 24 'අදාල පාර්ශව අනාවරණ'' අනුව ප්‍රධාන කළමණාකරන පුද්ගලයන් යන්නට සැලසුම් කිරීම, අධ්‍යක්ෂණය, සහ ව්‍යාපාරයේ කටයුතු පාලනය කිරීමට අධිකාරීත්වය ඇති පුද්ගලයන් ඇතුලත් වේ. ඒ අනුව අරමුදලේ කොමසාරිස් මණ්ඩලය සමාගමේ ප්‍රධාන කළමණාකරන පුද්ගලයන් ලෙස වර්ග කර ඇත.

| **23.2 ප්‍රධාන කළමණාකරන පුද්ගලයන් හට වන්දි** | **2020** | **2019** |
|---|---|---|
| | රු | රු |
| **කෙටි කාලීන සේවා නියුක්ති ප්‍රතිලාභ** | | |
| කෙටි කාලීන සේවක ප්‍රතිලාභ | 1,133,735 | 969,300 |

* ප්‍රධාන කළමණාකරන පුද්ගලයන් සමග ඇති කරගෙන තිබෙන සේවා නියුක්ති ගිවිසුම් අනුව ඔවුන් හට අරමුදල මගින් මුදල් නොවන ප්‍රතිලාභ කිසිවක් ලබා දී නොමැත.

* ප්‍රධාන කළමණාකරන පුද්ගලයන්, ඔවුන්ගේ පවුලේ සාමාජිකයන්, සහ ඔවුන්ගේ සම්බන්ධතා ඇති ආයතන සමග අරමුදල කිසිදු ගණුදෙනුවක් සිදු කර නොමැති අතර කිසිදු වැඩ පිලිවෙලකට හෝ ගිවිසුමකටද ඇතුලත් වී නොමැත.

# දේශීය ණය සහ සංවර්ධන අරමුදල
## මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්
2020 දෙසැම්බර් 31 අවසන් වසර සඳහා

**24.LLDF ඛණ්ඩ ලෙස විස්තීර්ණ ආදායම**

| | 2020 | | | | |
|---|---|---|---|---|---|
| | දේ.ණ.සහ සං. අ. | LGIIP | PCDP | UDLIHP | ඒකාබද්ධ කිරීම-දේ.ණ.සහ අ |
| පොලී ආදායම | 144,092,126 | 133,194,551 | 4,030,562 | 77,320,332 | 358,637,571 |
| පොලී වියදම | 8,775,382 | 47,445,528 | 4,020,722 | 71,503,097 | 131,744,730 |
| **ශුද්ධ පොලී ආදායම** | **135,316,745** | **85,749,022** | **9,840** | **5,817,234** | **226,892,841** |
| වෙනත් මෙහෙයුම් ආදායම් | 2,363,423 | - | - | - | 2,363,423 |
| **මුළු මෙහෙයුම් ආදායම** | **137,680,168** | **85,749,022** | **9,840** | **5,817,234** | **229,256,264** |
| අපහායන ගාස්තු | 3,427,599 | 1,248,382 | 144,472 | 2,825,643 | 7,646,096 |
| **ශුද්ධ මෙහෙයුම් ආදායම** | **134,252,569** | **84,500,641** | (134,633) | **2,991,591** | **221,610,168** |
| පුද්ගල වියදම් | 15,983,506.61 | 9,954,738.50 | **1,142** | 675,332 | 26,614,719 |
| ක්ෂය PPE | 891,917.45 | 555,498 | **64** | 37,685 | 1,485,164 |
| ප්‍රදාන ක්‍රමක්ෂය | - | 115,998,584 | - | - | 115,998,584 |
| වෙනත් මෙහෙයුම් වියදම් | 6,036,454.83 | 3,759,583.60 | **431** | 255,051.06 | 10,051,521 |
| **බදුවලට පෙර මෙහෙයුම් ලාභය** | **111,340,690** | **(45,767,763)** | (136,270) | **2,023,523** | **67,460,197** |

| | 2019 | | | | |
|---|---|---|---|---|---|
| | **LLDF** | **LGIIP** | **PCDP** | **UDLIHP** | **Consolidation-LLDF** |
| පොලී ආදායම | 113,899,983 | 183,625,584 | 4,240,006 | 96,125,503 | 397,891,076 |
| පොලී වියදම | 10,348,303 | 43,965,189 | 4,240,007 | 76,260,173 | 134,813,672 |
| **ශුද්ධ පොලී ආදායම** | **103,551,680** | **139,660,394** | **(0)** | **19,865,330** | **263,077,404** |
| වෙනත් මෙහෙයුම් ආදායම් | 2,219,818 | - | - | - | 2,219,818 |
| **මුළු මෙහෙයුම් ආදායම** | **105,771,499** | **139,660,394** | **(0)** | **19,865,330** | **265,297,223** |
| අපහායන ගාස්තු | 1,789,718 | 967,806 | 91,380 | 1,839,014 | 4,687,918 |
| **ශුද්ධ මෙහෙයුම් ආදායම** | **103,981,780** | **138,692,588** | (91,380) | **18,026,316** | **260,609,304** |
| පුද්ගල වියදම් | 10,365,140 | 13,686,102.78 | **(0)** | 1,946,715 | 25,997,958 |
| ක්ෂය PPE | 1,195,97 | 1,579,177 | **(0)** | 224,623 | 2,999,786 |
| ප්‍රදාන ක්‍රමක්ෂය | - | 153,588,013 | - | - | 153,588,013 |
| වෙනත් මෙහෙයුම් වියදම් | 4,814,303.45 | 6,356,793 | **(0)** | 904,191.84 | 12,075,288 |
| **බදුවලට පෙර මෙහෙයුම් ලාභය** | **87,606,350** | **(36,517,498)** | (91,380) | **14,950,787** | **65,948,259** |

*මූල්‍ය වර්ෂය අවසානයේදී ගෙවිය යුතු ප්‍රාග්ධනය මත පදනම්ව අපහායන ගාස්තු බෙදා ඇත.

**එක් එක් ඛණ්ඩයෙහි මුළු මෙහෙයුම් ආදායම මත මෙහෙයුම් පිරිවැය බෙදනු ලැබේ.

# දේශීය ණය සහ සංවර්ධන අරමුදල

## මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

2020 දෙසැම්බර් 31 අවසන් වසර සඳහා

**25. සාධාරණ අගයන්**

ආදර්ශයන් සඳහා බාහිරින් කැඳවනු ලබන මිල ගණන් ඇසුරින් හෝ නිරීක්ෂණය කළ හැකි මිල යෙදවුම් ඇසුරින් සාධාරණ අගය තීරණය කරනු ලබනා අවස්ථාවන්හිදී මූල්‍ය උපකරණ සඳහා ස්වාධීන මිල තීරණයන් හෝ තහවුරු කිරීම් ලබාගන්නා ලදී. ක්‍රියාශීලී වෙළඳපලකදී විකුණුම් මිල පිලිබඳ ඍජු නිරීක්ෂණයන් කළ නොහැකිය. මේ තත්වයන් යටතේ සමාගම මූල්‍ය උපකරණයන්හි වලංගුතාව තහවුරු කිරීම පිණිස, වඩා අදාල සහ විශ්වසනීය සේ සැලකෙන තොරතුරු වලට වැඩි බරක් තබමින් විකල්ප වෙළඳපල තොරතුරු භාවිතා කරයි.

ඇගයුම් තාක්ෂණවේදයන් මගින් මූල්‍ය උපකරණයන්හී සාධාරණ අගය තීරණය කිරීම හෝ අනාවරණය කිරීම පිණිස අරමුදල පහත සඳහන් ධූරාවලිය භාවිතා කරයි.

**අදියර 1:** සමාන වත්කම් සහ වගකීම් සඳහා සක්‍රීය වෙළඳපලින් කැඳවන ලද මිල ගණන් (ගැලපුම් නොකරනලද)

**අදියර 2:** ඍජුව හෝ වක්‍රව වාර්තා කරන ලද සාධාරණ අගය මත වැදගත් බලපෑමක් ඇත්තාවූ සියළු යෙදවුම් නිරීක්ෂණය කළ හැකි අනෙක් තාක්ෂණවේදයන්.

**අදියර 3:** නිරීක්ෂණය කළ නොහැකි වෙළඳපල දත්ත මත පදනම් නොවන වාර්තාගත සාධාරණ අගය මත වැදගත් බලපෑමක් ඇති යෙදවුම් භාවිතා කරන ශිල්ප ක්‍රම

මූල්‍ය ප්‍රකාශණයන්හී සාධාරණ අගය මගින් නොදැක්වෙන අරමුදලේ මූල්‍ය උපකරණ වල සාධාරණ අගය සහ ඉදිරියට ගෙනා අගය පිලිබඳ පංතිය අනුව සංසන්දනයක් පහත දැක්වේ.

| දෙසැම්බර් 31 දිනට | සාධාරණ අගය පිළිබඳ ධූරාවලිය | ඉදිරියට ගෙනා වටිනාකම 2020 රු | ඉදිරියට ගෙනා වටිනාකම 2019 රු | සාධාරණ අගය 2020 රු | සාධාරණ අගය 2019 රු |
|---|---|---|---|---|---|
| **මූල්‍ය වත්කම්** | | | | | |
| මුදල් සහ මුදල් සමාන දෑ | | 172,730,801 | 128,859,193 | 172,730,801 | 128,859,193 |
| බැංකු ශේෂයන් | | 998,000,000 | 1,068,000,000 | 998,000,000 | 1,068,000,000 |
| ණය සහ ලැබිය යුතුදෑ | අදියර 2 | 3,418,230,960 | 3,420,051,228 | 1,317,876,008 | 1,318,577,801 |
| වෙනත් වත්කම් | | 206,139,809 | 375,839,910 | 206,139,809 | 375,839,910 |
| **එකතුව** | | **4,795,101,570** | **4,992,750,332** | **2,694,746,618** | **2,891,276,904** |
| **මූල්‍ය වගකීම්** | | | | | |
| ණයට ගැනුම් සහ භාණ්ඩාගාරයට ගෙවුම් සඳහා දරණ පොලිය | අදියර 2 | 4,846,265,690 | 5,084,930,312 | 1,431,115,691 | 1,501,594,015 |
| වෙනත් වගකීම් | | 61,164,460 | 96,579,645 | 61,164,460 | 96,579,645 |
| **එකතුව** | | **4,907,430,150** | **5,181,509,957** | **1,492,280,150** | **1,598,173,660** |

අ) කෙටි කාලීනව කල් පිරෙන මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම් සඳහා (මාස තුනකට අඩු) ඉදිරියට ගෙනා වටිනාකම ඒවායේ සාධාරණ අගයට දළ වශයෙන් සමාන වන බව උපකල්පනය කෙරේ. මෙකී උපකල්පනය අතැති මුදල්, බැංකු ශේෂයන්, අනෙක් මූල්‍ය වත්කම්, බැංකු අයිරා සහ කල්පිරෙන විශේෂිත කාලයක් නැති අනෙක් මූල්‍ය වගකීම් සඳහා අදාල වේ.

ආ) සාමාන්‍ය ණය කාලසීමාව සඳහා වන සාමාන්‍ය ණය අනුපාතය භාවිතා කරමින් ස්ථාවර පොලී අනුපාත ඇති ලැබිය යුතු ණය සාධාරණ අගයට ලක් කෙරිණි. මීට ප්‍රතිවිරුද්ධව පොලී සහිත ණය සහ භාණ්ඩාගාරයට ගෙවිය යුතු වටිනාකම් බරතැබූ සාමාන්‍ය අරමුදල් පිරිවැය මත වට්ටම් කරන ලදී.

# දේශීය ණය සහ සංවර්ධන අරමුදල
## මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්
2020 දෙසැම්බර් 31 අවසන් වසර සඳහා

**26. වත්කම් සහ වගකීම් කල් පිරීම**

| | 2020 | | | 2019 | | |
|---|---|---|---|---|---|---|
| | වසරකට අඩු | වසරකට වැඩි | ඉදිරියට ගෙනා මුළු වටිනාකම | වසරකට අඩු | වසරකට වැඩි | ඉදිරියට ගෙනා මුළු වටිනාකම |
| **වත්කම්** | රු | රු | රු | රු | රු | රු |
| මුදල් සහ මුදල් සමාන දෑ | 172,730,801 | - | 172,730,801 | 128,859,193 | - | 128,859,193 |
| බැංකු ශේෂයන් | 998,000,000 | - | 998,000,000 | 1,068,000,000 | - | 1,068,000,000 |
| ණය සහ ලැබිය යුතුදෑ | 410,421,549 | 3,007,809,411 | 3,418,230,960 | 423,336,269 | 2,996,714,959 | 3,420,051,228 |
| දේපල පිරියත සහ උපකරණ | - | 2,793,524 | 2,793,524 | - | 2,203,250 | 2,203,250 |
| විලම්බිත බදු වත්කම් | | 9,543,736 | 9,543,736 | - | 7,048,384 | 7,048,384 |
| වෙනත් වත්කම් | 61,850,346 | 144,289,463 | 206,139,809 | 72,006,176 | 303,833,734 | 375,839,910 |
| **මුළු වත්කම්** | 1,643,002,696 | 3,164,436,133 | 4,807,438,829 | 1,692,201,638 | 3,309,800,328 | 5,002,001,966 |
| **වගකීම්** | | | | | | |
| පොලී සහිත ණය සහ භාණ්ඩාගාරයට ගෙවිය යුතු | 252,858,307 | 4,593,407,383 | 4,846,265,690 | 217,973,945 | 4,866,956,368 | 5,084,930,312 |
| වර්තමාන බදු වගකීම | - | - | - | - | - | - |
| විලම්බිත බදු වගකීම | - | - | - | - | - | - |
| පශ්චාත් රැකියා නියුක්ති වාසි පිළිබඳ බැඳීම් | - | 5,205,473 | 5,205,473 | - | 4,075,872 | 4,078,872 |
| වෙනත් වගකීම් | 16,467,880 | 44,696,579 | 61,164,460 | 8,337,378 | 88,242,267 | 96,579,645 |
| | 269,326,187 | 4,643,309,435 | 4,912,635,622 | 226,311,323 | 4,959,277,506 | 5,185,588,829 |

# දේශීය ණය සහ සංවර්ධන අරමුදල
## මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්
2020 දෙසැම්බර් 31 අවසන් වසර සඳහා

**27. අවදානම් කළමණාකරනය**

**27.1 හැඳින්වීම**

සිය මූල්‍ය උපකරණ භාවිතා කිරීමේදී අරමුදල පහත අවදානම්වලට නිරාවරණය වේ. :

ණය අවදානම
ද්‍රවශීලතා අවදනාම
වෙළඳපල අවදානම

මේ සටහන මගින් අරමුදලේ එකිනෙක අවදානමට නිරාවරණය වීම, අරමුදලේ අරමුණු, ප්‍රතිපත්ති සහ අවදානම් මැනීම සහ කළමණාකරනය පිළිබඳ තොරතුරු ඉදිරිපත් කෙරේ.

**27.2 ණය අවදානම**

ණය අවදානම යනු පාරිභොගිකයකු හෝ මූල්‍ය උපකරණයන්ට සමපාර්ශවයක් සිය ගිවිසුම්ගත බැඳීම් ඉටු කිරීමට අසමත් වීම හේතුවෙන් අරමුදලට සිදුවන මූල්‍ය හානියකි. ප්‍රධාන වශයෙන්ම ණය අවදානමක් හට ගනුයේ ලැබිය යුතු ණය සම්බන්ධයෙන් අරමුදලට ලැබිය යුතු දෑ සහ බැංකු සහ මූල්‍ය ආයතන වෙතැති තැන්පතු සම්බන්ධයෙනි.

ණය වටිනාකම් ඇගයුම සහ පිරිනමනු ලබන ණය කාලීන සමාලෝචනයට ලක් කිරීම මගින් ණය අවදානම කළමනාකරනය කරනු ලබයි.

අරමුදල ණය සහ ලැබිය යුතු දෑ සම්බන්ධයෙන් ලැබිය යුතුවන දෑ සම්බන්ධව සිදුවන හානි පිළිබඳ ඇස්තමේන්තුවක් ඉදිරිපත් කරනා අපහායනයන් උදෙසා වන දීමනාවක් ස්තාපිත කරයි. හානි සිදුවීම හට ගෙන ඇති එහෙත් හඳුනාගෙන නැති අවස්ථාවන්හිදී ව්‍යාපෘති පදනමින් සමාන ලැබිය යුතු දෑ වෙනුවෙන් ණය අවදානම වෙනුවෙන් ස්ථාපිත සාමූහික අපහායනය උදෙසා වන දීමනාවකින් අරමුදලේ අපහායන ප්‍රතිපත්තිය සමන්විත වේ. මේ සාමූහික අපහායනය තීරණය කරනු ලබන්නේ සමාන මූල්‍ය වත්කම් සඳහා ගෙවුම් සංඛ්‍යාලේඛණයන්හී ඓතිහාසික දත්ත මත පදනම්වය.

27.2.1 **අමතර ඇප සහ ණය ඉහල දැමීම් හී සාධාරණ අගය**

අරමුදලේ අමතර ඇප සහ ණය ඉහල දැමීම් හී සාදාරණ අගය පහත වගුවෙන් දැක්වේ.

| **2020 දෙසැම්බර් 31 දිනට** | **2020** | | **2019** | |
|---|---|---|---|---|
| | ණය අවදානමට උපරිම නිරාවරණය වීම | ශුද්ධ නිරාවරණය වීම | ණය අවදානමට උපරිම නිරාවරණය වීම | ශුද්ධ නිරාවරණය වීම |
| | රු | රු | රු | රු |
| මුදල් සහ මුදල් සමාන දෑ | 172,730,801 | 172,730,801 | 128,859,193 | 128,859,193 |
| බැංකු සහ මූල්‍ය ආයතනයන්හී ශේෂය | 998,000,000 | 998,000,000 | 1,068,000,000 | 1,068,000,000 |
| ණය සහ ලැබිය යුතු දෑ | 3,418,230,960 | 3,418,230,960 | 3,420,051,228 | 3,420,051,228 |
| වෙනත් මූල්‍ය වත්කම් | 206,139,809 | 206,139,809 | 375,839,910 | 375,839,910 |
| | 4,795,101,570 | 4,795,101,570 | 4,992,750,332 | 4,992,750,332 |

**27.** **අවදානම් කළමණාකරනය (ඉතිරි...)**

**27.2** **ණය අවදානම (ඉතිරි...**

**27.2.2** **මූල්‍ය වත්කම් හී පංතිය අනුව ණය තත්වය**

**a) 2020 දෙසැම්බර් 31 දිනට**

| | ලැබිය යුතු කල් ඉකුත්වූ හෝ අපහායනය නොකරන ලද **Neither past due nor impaired** | ලැබිය යුතු කල් ඉකුත්වූ හෝ අපහායනය නොකරන ලද | තනි තනිව අපහායනය කරන ලද | එකතුව |
|---|---|---|---|---|
| **වත්කම්** | රු | රු | රු | රු |
| මුදල් සහ මුදල් සමාන දෑ | 172,730,801 | | | 172,730,801 |
| බැංකු ශේෂ | 998,000,000 | | | 998,000,000 |
| ණය සහ ලැබිය යුතු දෑ | 3,422,918,878 | 34,251,263 | 866,151,995 | 4,323,322,136 |
| වෙනත් වත්කම් | 206,139,809 | | | 206,139,809 |
| **මුළු වත්කම් එකතුව** | **4,799,789,488** | **34,251,263** | **866,151,995** | **5,700,192,746** |

**b) 2019 දෙසැම්බර් 31 දිනට**

| | ලැබිය යුතු කල් ඉකුත්වූ හෝ අපහායනය නොකරන ලද | ලැබිය යුතු කල් ඉකුත්වූ හෝ අපහායනය නොකරන ලද | තනි තනිව අපහායනය කරන ලද | එකතුව |
|---|---|---|---|---|
| **වත්කම්** | රු | රු | රු | රු |
| මුදල් සහ මුදල් සමාන දෑ | 128,859,193 | - | - | 128,859,193 |
| බැංකු ශේෂ | 1,068,000,000 | - | - | 1,068,000,000 |
| ණය සහ ලැබිය යුතු දෑ | 3,424,739,146 | 34,041,704 | 863,403,376 | 4,322,184,226 |
| වෙනත් වත්කම් | 375,839,910 | - | | 375,839,910 |
| **මුළු වත්කම් එකතුව** | **4,997,418,249** | **34,041,704** | **863,403,376** | **5,894,883,330** |

# දේශීය ණය සහ සංවර්ධන අරමුදල

## මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

2020 දෙසැම්බර් 31න් අවසන් වසර සඳහා

**27. අවදානම් කළමණාකරනය (ඉතිරි...)**

**27.3 ද්‍රවශීලතා අවදානම**

මුදල් හෝ වෙනත් මූල්‍ය වත්කම් යෙදවීම මගින් පියවනු ලබනා මූල්‍ය වගකීම් හා බැඳුනු බැඳීම් සම්පූර්ණ කිරීමට යාමේදී අරමුදලට ඇතිවන අවදානම ද්‍රවශීලතා අවදානම නම් වේ.

ද්‍රවශීලතා අවදානම කළමණාකරනය කිරීම සඳහා සමාගම සියළු මූල්‍ය උපකරණයන් පිලිබඳ කල්පිරුම් විශ්ලේෂණය භාවිතා කරයි.

**අ) ද්‍රවශීලතා අවදානමට නිරාවරණය වීම**

සිය ප්‍රධාන අරමුදල් සම්පාදන මූලාශ්‍රය ලෙස අරමුදල ණය ගැනීම් කෙරේ විශ්වාසය තබයි. තරගකාරී මිල ගණන් පවත්වා ගැනීම සහ වෙළඳපල ප්‍රවණතා පිලිබඳ අනුවර්ත අධීක්ෂණය මගින් අරමුදල සක්‍රියව අවදානම කළමණාකරනය කරයි.

**ආ) ද්‍රවශීලතා අවදානම කළමණාකරනය කිරීම**

ද්‍රවශීලතා කළමණාකරනය පිණිස අරමුදලේ ප්‍රවේශය වනුයේ අරමුදල් සම්පාදකයන් සමග වන ණය ගිවිසුම් සහ නියාමන අවශ්‍යතා නිතිපතා පවත්වාගෙන යන අතර අරමුදලේ මූල්‍ය තත්වය අවදානමේ නොහෙලා නැතිනම් අනවශ්‍ය හානි සිදු නොවන බවට වගබලා ගනිමින් අවශ්‍ය වන පරිදි ප්‍රමාණවත් ද්‍රවශීලතාවන් තිබෙන බවට වගබලා ගැනීමයි.

**27.3.1** වට්ටම් රහිත දළ පිටතට ගලා යාම් මත පදනම්ව මූල්‍ය වගකීම් පිළිබඳ කල්පිරීම් විශ්ලේෂණය

අ) **2020 දෙසැම්බර් 31 දිනට**

| | ඉදිරියට ගෙනා වටිනාකම | දළ නාමික පිටතට ගලා යාම් | ඉල්ලුම මත | මාස 3 දක්වා | මාස 3 සිට 12 දක්වා | වසරකට වැඩි |
|---|---|---|---|---|---|---|
| පොලී සහිත ණය ගැනුම් සහ භාණ්ඩාගාරයට ගෙවිය යුතු | 4,846,265,690 | 4,967,044,408 | - | - | 373,637,025 | 4,593,407,383 |
| වෙනත් වගකීම් | 61,164,460 | 61,164,460 | - | 420,827 | 229,123 | 60,514,510 |
| | **4,907,430,150** | **5,028,208,868** | **-** | **420,827** | **373,866,148** | **4,653,921,893** |

ආ) **2019 දෙසැම්බර් 31 දිනට**

| | ඉදිරියට ගෙනා වටිනාකම | දළ නාමික පිටතට ගලා යාම් | ඉල්ලුම මත | මාස 3 දක්වා | මාස 3 සිට 12 දක්වා | වසරකට වැඩි |
|---|---|---|---|---|---|---|
| පොලී සහිත ණය ගැනුම් සහ භාණ්ඩාගාරයට ගෙවිය යුතු | 5,084,930,312 | 5,216,670,417 | - | - | 349,714,049 | 4,866,956,368 |
| වෙනත් වගකීම් | 96,579,645 | 96,570,645 | | 1,331,215 | 865,123 | 94,383,307 |
| | **5,181,509,957** | **5,313,250,062** | **-** | **1,331,215** | **350,579,172** | **4,961,339,675** |

# දේශීය ණය සහ සංවර්ධන අරමුදල

## මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

2020 දෙසැම්බර් 31න් අවසන් වසර සඳහා

**27.** **අවදානම් කළමණාකරනය (ඉතිරි...)**

**27.4** **වෙළඳපල අවදානම**

වෙළඳපල අවදානම යනු මූල්‍ය ආයතනයක අනාගත මුදල් ප්‍රවාහයන් හී සාධාරණ අගය වෙළඳපල මිල ගණන් වෙනස් වීම මත උච්ඡාවචනය වීමේ අවදානමයි.

අරමුදලේ මෙකී වෙළඳපල අවදානම ප්‍රධාන වශයෙන්ම සමන්විත වනුයේ පොලී අනුපාත අවදානම සහ මුදල් අවදානම මගිනි.

වෙළඳපල අවදානම කළමණාකරනය කිරීමේ ප්‍රධාන අරමුණ වනුයේ ලාභය ප්‍රශස්ත මට්ටමක පවත්වා ගනිමින් පිලිගත හැකි පරාමිතීන් තුළ අවදානම් සඳහා නිරාවරණය වීමේ ඉඩ කළමණාකරනය සහ පාලනය කිරීමයි. .

**27.4.1** පහත වගුව මගින් වෙළඳ නොවන මූල්‍ය වත්කම් සහ වගකීම් මත අරමුදලේ පොලී අනුපාත අවදානම් නිරාවරණය විශ්ලේෂණය කිරීමයි. සමාගමේ වත්කම් සහ වගකීම් ඉදිරියට ගෙනා වටිනාකම් තුළ ඇතුලත් වන අතර ගිවිසුම්ගත ප්‍රති මිලකරණය හෝ කල්පිරෙන දින මගින් වර්ගීකරණය කරනු ලබයි.

a)

| 2020 දෙසැම්බර් 31 දිනට | ඉල්ලුම මත | මාස 3 ට අඩු | මාස 4 සිට 12 දක්වා | වසර 1 සිට 5 දක්වා | 2020දෙසැම්බර් 31 දිනට එකතුව |
|---|---|---|---|---|---|
| **පොලී ඉපයුම් වත්කම්** | | | | | |
| මුදල් සහ මුදල් සමාන දෑ | 172,730,801 | - | - | - | 172,730,801 |
| බැංකු ශේෂ | - | 998,000,000 | - | - | 998,000,000 |
| ණය සහ ලැබිය යුතු දෑ | - | 102,605,387 | 307,816,161 | 3,007,809,411 | 3,418,230,960 |
| වෙනත් වත්කම් | - | - | 61,850,346 | 144,289,463 | 206,139,809 |
| **මුළු පොලී ඉපයුම් වත්කම්** | **172,730,801** | **1,100,605,387** | **369,666,508** | **3,152,098,874** | **4,795,101,570** |
| **පොලී සහිත වගකීම්** | | | | | |
| පොලී සහිත ණය සහ ගැණුම් සහ භාණ්ඩාගාරයට ගෙවිය යුතු දෑ | - | - | 252,857,307 | 4,593,407,383 | 4,846,265,690 |
| වෙනත් වගකීම් | - | 420,827 | 229,123 | 60,514,510 | 61,164,460 |
| **මුළු පොලී සහිත වගකීම්** | **-** | **420,827** | **253,087,430** | **4,653,921,893** | **4,907,430,150** |
| පොලී ඉපයුම් වත්කම් පොලී සහිත වගකීම් - ශුද්ධ වත්කම්/(වගකීම් අතර පරතරය | **172,730,801** | **1,100,184,560** | **116,579,078** | **(1,501,823,019)** | **(112,328,580)** |

# දේශීය ණය සහ සංවර්ධන අරමුදල

## මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

2020 දෙසැම්බර් 31න් අවසන් වසර සඳහා

**27.** **අවදානම් කළමණාකරනය (ඉතිරි...)**

| **b) 2019 දෙසැම්බර් 31 දිනට** | **ඉල්ලුම මත** | **මාස 3 ට අඩු** | **මාස 4 සිට 12 දක්වා** | **වසර එකට වැඩි** | **2019 දෙසැම්බර් 31 දිනට එකතුව** |
|---|---|---|---|---|---|
| **පොලී ඉපයුම් වත්කම්** | | | | | |
| මුදල් සහ මුදල් සමාන දෑ | 128,859,193 | - | - | - | 128,859,193 |
| බැංකු ශේෂ | - | 1,068,000,000 | - | - | 1,068,000,000 |
| ණය සහ ලැබිය යුතු දෑ | - | 102,660,026 | 307,980,079 | 3,009,411,123 | 3,402,051,228 |
| වෙනත් වත්කම් | - | - | 72,006,176 | 303,833,734 | 375,839,910 |
| **මුළු පොලී ඉපයුම් වත්කම්** | **128,859,193** | **1,170,660,026** | **379,986,255** | **3,313,244,857** | **4,992,750,332** |
| **පොලී ඉපයුම් වගකීම්** | | | | | |
| පොලී සහිත ණය ගැනුම් සහ භාණ්ඩාගාරයට ගෙවිය යුතු දෑ | - | - | 217,973,945 | 4,866,956,368 | 5,084,930,312 |
| වෙනත් වගකීම් | - | 1,331,215 | 865,123 | 94,383,307 | 96,579,645 |
| **මුළු පොලී සහිත වගකීම්** | - | **1,331,215** | **218,839,068** | **4,961,339,675** | **5,181,509,957** |
| පොලී සහිත වත්කම් සහ පොලී සහිත වගකීම් අතර පරතරය | **128,859,193** | **1,169,328,812** | **161,147,187** | **(1,648,094,818)** | **(188,759,625)** |

**27.4.2 පොලී අනුපාත සංවේදීතාව**

විස්තීර්ණ ආදායම් ප්‍රකාශයෙහි පවත්වාගන්නා අනෙක් සියළු විචල්‍යයන් සමග පොලී අනුපාතයන්හී සිදුවිය හැකි සාධාරණ වෙනස්කම් පිලිබඳ සංවේදීතාව පහත වගුව මගින් ඉදිරිපත් කෙරේ.

| | 2020 | | 2019 | |
|---|---|---|---|---|
| | පොලී අනුපාතයේ වැඩිවීම/අඩුවීම | බදු වලට පෙර ලාභයට වන බලපෑම | පොලී අනුපාතයේ වැඩිවීම/අඩුවීම | බදු වලට පෙර ලාභයට වන බලපෑම |
| | | රු | | රු |
| පොලී අනුපාත | + 1% | 6,746,018 | + 1% | 6,594,826 |
| පොලී අනුපාත | - 1% | (6,746,018) | - 1% | (6,594,826) |

# ගිණුම්කරණ ප්‍රතිපත්ති

දේශීය ණය සහ සංවර්ධන අරමුදල

2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වසර සඳහා
ගිණුම්කරණ ප්‍රතිපත්ති

**වාර්තා කරනු ලබන ආයතනය**

## 1.1. සාමාන්‍ය තොරතුරු

දේශීය ණය සහ සංවර්ධන අරමුදල යනු (දේ.ණ.සහ.සං.අ) 1916 අංක 22 දරණ දේශීය ණය සහ සංවර්ධන අරමුදල් ආඥා පණත මගින් ස්ථාපිත කරන ලද ව්‍යවස්ථාපිත ආයතනයකි. එහි ලියාපදිංචි කාර්යාලය පිහිටා ඇත්තේ ශ්‍රී ලංකාවේ කොළඹ 7 වෝඩ් පෙදෙසෙහි අංක 24 ඒ යන ස්ථානයෙහිය.

## 1.2. ප්‍රධාන කාර්යයන් සහ මෙහෙයුම් හී ස්වභාවය

මෙකී අරමුදලෙහි ප්‍රධාන කර්තව්‍යය වනුයේ පොදු පහසුකම් උදෙසා දේශීය අධිකාරීන් හට ණය පහසුකම් සම්පාදනය කිරීමය. දේශීය ණය සංවර්ධන අරමුදලේ ඉලක්කය වනුයේ දේශීය මට්ටමේ යටිතල පහසුකම් සඳහා මූල්‍යනය කරනා නියමු මූල්‍ය ආයතනයක් බවට පත්වීමය.

## 2. සැකසීමේ පදනම

## 2.1. ඒකාබද්ධ කිරීම සඳහා පදනම

දේශීය ණය සංවර්ධන අරමුදලේ, නාගරික සංවර්ධන අඩු ආදායම් නිවාස ව්‍යාපෘතියේ, බහු වාර්ෂික භෝග සංවර්ධන ව්‍යාපෘතියේ සහ පලාත් පාලන යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතියේ උප කර්තව්‍යයන් ලෙස ඍජු ආදායම් සහ වියදම් වෙන වෙනම ක්‍රියාත්මක කර වසර අවසානයේ දී ඒකාබද්ධ කරනු ලබනා කොටස් හඳුනාගනු ලබයි. වත්කම් සහ වගකීම් ද ශේෂ පත්‍රෙයහි ඒකාබද්ධ කරනු ලැබේ.

## 2.2. ක්‍රියාකාරී සහ ඉදිරිපත් කිරීමේ මුදල්

ඒකාබද්ධ මූල්‍යයන් ශ්‍රී ලංකා රුපියල් මගින් ඉදිරිපත් කරනු ලබන අතර සියළු වටිනාකම් වෙනත් ආකාරයකට දක්වා නොමැති සෑම අවස්ථාවකදීම ආසන්නතම රුපියලට ගණන් බලා ඇත.

## 2.3. අනුකූලතා ප්‍රකාශය

මූල්‍ය තත්ව ප්‍රකාශය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, ව්‍යාපාර වස්තුවල වෙනස් වීම පිලිබඳ ප්‍රකාශය, මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශ සහ මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් යන ලේඛන වලින් අරමුදලේ මූල්‍ය ප්‍රකාශය සමන්විත වන අතර ඒවා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් සකසන ලද ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිති වලට අනුකූලව සකසා ඉදිරිපත් කර ඇත. (SLFRSs and LKASs)

දේශීය ණය සහ සංවර්ධන අරමුදල

2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වසර සඳහා
ගිණුම්කරණ ප්‍රතිපත්ති

**2.4 මූල්‍ය ප්‍රකාශ පිලිබඳ වගකීම**

ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිති වලට අනුකූල වන සේ මූල්‍ය ප්‍රකාශන පිලියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් කොමසාරිස් මණ්ඩලය වගකීමට බැඳෙයි. මෙකී වගකීමට පහත අංශ ඇතුලත් වේ. වංචා සහ වැරදි හේතුවෙන් සිදුවිය හැකි වැරදි ප්‍රකාශයන්ගෙන් තොරව ප්‍රකාශන පිලියෙල කිරීම සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාම.

**2.5. කොමසාරිස් මණ්ඩලය විසින් මූල්‍ය ප්‍රකාශන අනුමත කිරීම**

**2020** දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වසර සඳහා වන අරමුදලේ මූල්‍ය ප්‍රකාශ **2021** පෙබරවාරි **25** දින කොමසාරිස් මණ්ඩලය විසින් අනුමත කර තිබේ.

**2.6. මිණුම් සඳහා වන පදනම**

මූල්‍ය තත්වය පිලිබඳ ප්‍රකාශයෙහි දැක්වෙන පහත සඳහන් ද්‍රව්‍යමය අයිතමයන් හැරුණ විට අරමුදලේ මූල්‍ය ප්‍රකාශයන් ඓතිහාසික පිරිවැය පදනම මත පිලියෙල කර ඇත.

| අයිතම | මිණුම් සඳහා වන පදනම |
|---|---|
| නිර්වචනය කරන ලද ප්‍රතිලාභ බැඳීම් | සැලසුම්ගත වත්කම්වල සාධාරණ අගය අඩු කල පසු නිර්වචනය කරන ලද ප්‍රතිලාභ බැඳීම් හී වර්තමාන වටිනාකම හඳුනාගැනීම |

**2.7. කැපී පෙනෙනා ගිණුම්කරණ විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පනයන්**

ගිණුම්කරන ප්‍රතිපත්ති භාවිතා කිරීම සහ වත්කම්, වගකීම්, ආදායම් සහ වියදම් හී වාර්තාකරණ ලද ප්‍රමාණයන්ට බලපානු ලබනා විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පනයන් සැකසීමට කළමණාකරනයට අවශ්‍ය වන්නාවූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල වන අයුරින් අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිලියෙල කිරීම. මෙකී ඇස්තමේන්තු වලට වඩා තථ්‍ය ප්‍රතිඵල වෙනස් විය හැකිය. පෙර කාල පරිච්ඡේදයට අදාලව වාර්තා කරන ලද ඇතැම් සංඛ්‍යාවන් වැරදි නිවැරදි කිරීමේ අරමුණින් නැවත ප්‍රකාශ කර ඇත. ඇස්තමේන්තු සහ වැදගත් උපකල්පනයන් අඛණ්ඩ පදනමින් සමාලෝචනය කරනු ලැබේ. ඇස්තමේන්තු සංශෝධනය කරනු ලබනා සහ බලපානු ලබනා අනාගත කාල පරිච්ඡේදයන් තුළ ගිණුම්කරණ ඇස්තමේන්තු පිලිබඳ සංශෝධනයන් හඳුනා ගැනේ. ඇස්තමේන්තු කරනු ලබනා වඩාම වැදගත් කලාප, අරමුදලේ මූල්‍ය ප්‍රකාශනයන්හී හඳුනාගනු ලබන ප්‍රමාණයන්ට ඉහලම වැදගත් බලපෑම කරනා ගිණුම්කරන ප්‍රතිපත්ති භාවිතා කිරීමේදී වන අවිනිශ්චිතතා සහ තීරක විනිශ්චයන් පහත පරිදි දැක්වේ.

**2.7.1. අඛණ්ඩ පැවැත්ම පිලිබඳ ගිණුම්කරන පදනම**

අඛණ්ඩ පදනමින් ක්‍රියාත්මක වීම සඳහා අරමුදලට ඇති හැකියාව පිලිබඳව කොමසාරිස් මණ්ඩලය විසින් තක්සේරුවක් කර ඇති අතර පුරෝකථිත අනාගතය තුළ ඊට අඛණ්ඩව ව්‍යාපාර කටයුතු කරගෙන යාමට ප්‍රමාණවත් සම්පත් ඇති බවට මණ්ඩලය සෑහීමට පත්ව ඇත. තවද අඛණ්ඩ පදනමින් අරමුදලට ක්‍රියාත්මක වීමට වැදගත් බලපෑමක් කළ හැකි කිසිදු ද්‍රව්‍යමය අවිනිශ්චිතතාවක් ගැන මණ්ඩලය නොදන්නා අතර අරමුදලේ මෙහෙයුම් නවතා ලීමට හෝ ඇවර කිරීමට ඔවුහු අපේක්ෂා නොකරති. එහෙයින් අරමුදලේ මූල්‍ය ප්‍රකාශ අඛණ්ඩ පැවැත්ම පිලිබඳ පදනමින් අඛණ්ඩව පිලියෙල කෙරේ.

දේශීය ණය සහ සංවර්ධන අරමුදල

2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වසර සඳහා
ගිණුම්කරණ ප්‍රතිපත්ති

**2.7.2. ණය සහ ලැබිය යුතු දෑ මත අපහායන හානි**

විස්තීර්ණ ආදායම් ප්‍රකාශයෙහි අපහායන හානියක් වාර්තා කළ යුතුද යන්න තක්සේරු කිරීම පිණිස සෑම වාර්තාකරණ දිනයකම අරමුදල වෙන් වෙන්ව වැදගත් වන සෑම ණය සහ අත්තිකාරමක්ම සමාලෝචනයට ලක් කරයි. විශේෂයෙන්ම අපහායන හානි නිර්ණය කිරීමේදී අනාගත මුදල් ප්‍රවාහයන්හී ප්‍රමාණය සහ කාලය ඇස්තමේන්තු කිරීමට කළමණාකරනයේ විනිශ්චයන් අවශ්‍ය වේ. මෙකී ඇස්තමේන්තු සාධක ගණනාවක් පිලිබඳ උපකල්පනයන් මත පදනම් වන අතර අපහායන දීමනාවට කරනු ලබනා අනාගත වෙනස්කම් වල ප්‍රතිඵලයක් වශයෙන් තථ්‍ය ප්‍රතිඵල වෙනස් වීමට ඉඩ තිබේ. වාස්තවික සාක්ෂි ඇතිද එහි බලපෑම තවමත් පැහැදිලි නැති සිදුවූ හානි හේතුවෙන් ප්‍රතිපාදන සැපයිය යුතුදැයි තීරණය කිරීමට වෙන් වෙන්ව තක්සේරු කරන ලද සහ අපහායනය නොකරන ලදැයි පෙණුන ණය සහ අත්තිකාරම් සහ සියළු තනි තනිව ගත් කළ නොවැදගත් ණය සහ අත්තිකාරම් අනතුරුව තක්සේරු කරනු ලැබේ.

**2.7.3. බදුකරණය**

අරමුදල ආදායම් බදුවලට යටත්වන අතර මෙකී මූල්‍ය ප්‍රකාශනයන් පිලියෙල කරනු ලබන අවස්ථාව වන විට අදාල වන්නාවූ බදු නීති පිලිබඳ නිර්වචනයන්ට අදාලව පවතින අවිනිශ්චිතතා හේතුවෙන් වර්තමාන, විලම්බිත සහ අනෙක් බදු නිර්ණය කිරීමට විනිශ්චයක් අවශ්‍ය වේ.

**2.7.4. පශ්චාත් සේවා නියුක්ති ප්‍රතිලාභ වගකීම්**

පුරෝකථිත ඒකක ණය ක්‍රමය භාවිතා කරමින් වසරේ පශ්චාත් සේවා නියුක්ති ප්‍රතිලාභ වගකීම සහ අදාල ගාස්තුව තීරණය කරනු ලබයි. ඇගයුම් ක්‍රමය වට්ටම් අනුපාත, අනාගත වැටුප් වැඩිවීම්, මරණ අනුපාත ආදිය පිලිබඳ උපකල්පනයන් සමග සම්බන්ධ වේ. මෙකී වගකීම්වල දීර්ඝ කාලීන ස්වභාවය මත මේ ඇස්තමේන්තු කැපීපෙනෙනා අවිනිශ්චිතතාවන්ට යටත් වේ. සෑම වාර්තාකරණ කාල පරිච්ඡේදයකදීම සියළු උපකල්පනයන් සමාලෝචනය කරනු ලබයි.

**2.7.5. දේපල, පිරියත සහ උපකරණයන්හී ප්‍රයෝජනවත් ආයු කාලය**

සෑම වාර්තාකරණ දිනයකදීම අරමුදල වත්කම් හී ශේෂ වටිනාකම්, ප්‍රයෝජනවත් ආයු කාලය, ක්ෂය කිරීමේ ක්‍රම සමාලෝචනය කරයි. මෙකී වටිනාකම්, අනුපාත, ක්‍රමවේද ඇස්තමේන්තු කිරීමේදී කළමණාකරනයේ විනිශ්චය භාවිතා කරන අතර එහෙයින් එය අවිනිශ්චිතතාවන්ට යටත් වේ.

**2.8. වැදගත් ගිණුම්කරන ප්‍රතිපත්ති**

**2.8.1. බදුකරණය**

ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිති අංක - LKAS 12 (ආදායම් බදු) අනුව, වර්තමාන සහ විලම්බිත බදුකරණය සම්බන්ධයෙන් වන කාලපරිච්ඡේදය සඳහා ලාභ හෝ අලාභ තීරණය කිරීමේදී ඇතුලත් කරනා ප්‍රමාණයේ එකතුව බදු වියදම වේ. හිමිකම් තුළ සෘජුවම හඳුනාගන්නා අයිතමයන්හට හෝ හිමිකම් හෝ අනෙක් විස්තීර්ණ ආදායම් තුළ හඳුනාගන්නා අවස්ථාවන්හිදී අනෙක් විස්තීර්ණ ආදායම් දක්වා අදාල වන දුර හැර බදු වියදම විස්තීර්ණ ආදායම් ප්‍රකාශයෙහි ආදායම් බදු වියදම හඳුනා ගැනේ.

දේශීය ණය සහ සංවර්ධන අරමුදල

2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වසර සඳහා
ගිණුම්කරණ ප්‍රතිපත්ති

**අ) වර්තමාන බදු**

පනවන ලද බදු අනුපාත හෝ බදු නීති හෝ වාර්තාකරණ දිනයෙහිදී සැලකිය යුතු ලෙස පනවනු ලබන සහ පූර්ව වර්ෂවලට අදාලව ගෙවිය යුතු බදුවලට කරනා කවර හෝ ගැලපුම් භාවිතා කරමින් පවත්නා වර්ෂයට අදාලව දේශිය ආදායම් කොමසාරිස් ජනරාල් ගෙන් අය කරගනු හෝ ඔහුට ගෙවනු ලබන්නට අපේක්ෂා කරනා ප්‍රමාණයන්ගෙන් වර්තමාන බදු වත්කම් සහ වගකීම් සමන්විත වේ.

ඒ අනුව 2006 අංක 10 දරණ දේශීය ආදායම් පණතේ විධිවිධාන සහ මූල්‍ය ප්‍රකාශනයන්හී 10.2 සටහනේ විශේෂයෙන් දක්වා ඇති අනුපාත පිලිබඳ සංශෝධනයන් අනුව බදු කාර්යය සඳහා ගැලපුම් කරන ලද ලාභය මත බදු සඳහා ප්‍රතිපාදන සැපයේ.

**ආ) විලම්බීත බදුකරණය**

වත්කම් සහ වගකීම් වල බදු පදනම් සහ මූල්‍ය වාර්තාකරන කාර්යය උදෙසා ඒවායේ ඉදිරියට ගෙනා වටිනාකම් අතර වාර්තාකරණ දිනයට පවත්නා තාවකාලික වෙනස්කම් මත විලම්බීත බදු සම්පාදනය කෙරේ.

පනවනු ලැබ ඇති හෝ වාර්තාකරණ දිනය වන විට සැලකිය යුතු ලෙසින් පනවනු ලබනා නීති මත පදනම්ව, තාවකාලික වෙනස්කම් ආපසු හරවන අවස්ථාවේදී තාවකාලික වෙනස්කම් සඳහා අදාල කරගැනීමට අපේකෂිත බදු අනුපාත අනුව විලම්බීත බදු මනිනු ලැබේ.

වර්තමාන බදු වත්කම් සහ වගකීම් හිලව් කිරීම පිණිස නෛතිකව බලාත්මක හිමිකමක් තිබේ නම් විලම්බීත බදු වත්කම් සහ වගකීම් හිලවු කරනු ලබන අතර ඒවා එකම බදු අයකල හැකි ව්‍යාපාරයෙහි එකම බදු අධිකාරිය හෝ වෙනස් බදු අධිකාරීන් විසින් අයකරනු ලබනා ආදායම් බදුවලට අදාල වේ. නමුදු ශුද්ධ පදනමක් මත වර්තමාන බදු වත්කම් සහ වගකීම් පියවීමට අදහස් කෙරෙන අතර නැතිනම් බදු වත්කම් සහ වගකීම් එකවරම මුදල් කෙරේ.

භාවිතා කල හැකි දෙයට පටහැනිව තිබිය හැක්කාවූ අනාගත බදු අයකල හැකි ලාභයක පැවතිය හැකිදුරක් දක්වා භාවිතා නොකරන ලද බදු හානි, බදු ණය සහ අඩු කළ හැකි තාවකාලික වෙනස්කම් සඳහා විලම්බීත බදු වත්කමක් හඳුනා ගැනේ. සෑම වාර්තාකරණ දිනයකදීම විලම්බීත බදු සමාලෝචනය කරනු ලබන අතර තව දුරටත් අදාල බදු ප්‍රතිලාභ අත්කරගත නොහැකි දුරක් දක්වා අඩු කෙරේ.

විස්තීර්ණ ආදායම් ප්‍රකාශයෙහි විලම්බීත බදු වගකීම්වල ඉදිරියට ගෙනා වටිනාකම් හී ශුද්ධ වැඩිවීම විලම්බීත බදු වියදම ලෙස හඳුනාගන්නා අතර ඊට විලෝම වශයෙන් කවර ශුද්ධ අඩුවීමක් වුව විලම්බීත බදු වියදම ආපසු හැරවීමක් ලෙස හඳුනා ගැනේ.

### 2.8.2. මුදල් සහ මුදල සමාන දෑ

මුදල් සහ මුදල සමාන දෑ යනුවෙන් අදහස් කෙරෙනුයේ අතැති මුදල්, ඉල්ලුම් තැන්පතු, ක්ෂණිකව මුදල බවට හැරවිය හැක්කාවූ කෙටිකාලීන ආයෝජන සහ වටිනාකම් මාරුවේදී සුළු මට්ටමේ අවදානමකට යටත්වන්නාවූ දෑ ය.

දේශීය ණය සහ සංවර්ධන අරමුදල

2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වසර සඳහා
ගිණුම්කරණ ප්‍රතිපත්ති

මුදල් ප්‍රවාහ ප්‍රකාශය සම්බන්ධයෙන් ගත් කළ මුදල් සහ මුදල් සමාන දෑ සමන්විත වනුයේ අතැති මුදල්, බැංකු වල ඇති තැන්පතු ගෙවිය යුතු ශුද්ධ බැංකු අයිරාවන් යනාදියෙනි. එසේම අත්පත් කරගත් දිනට සිට මාස තුනක් හෝ ඊට අඩු කාලයක් ඇතුලත කල්පිරෙන්නාවූ මූල්‍ය උපකරණයන්ද මුදල් සමාන දෑ යන්නට ගැනේ.

### 2.8.3. දේපල, පිරියත සහ උපකරණ පිරිවැය

දේපල, පිරියත සහ උපකරණ පසුව එන කවර හෝ සමුච්චිත ක්ෂය සහ කවර හෝ පසු සමුච්චිත අපහායන හානි අඩුකල පිරිවැයට දැක්වේ. සියළුම ආකාරයේ දේපල, පිරියත සහ උපකරණ පලමුව වාර්තාකරනු ලබන්නේ පිරිවැයටය.
දේපල, පිරියත සහ උපකරණ යනු ඒ වත්කම් අපේක්ෂිත පාවිච්චියට ගත හැකි වන මට්ටමට ගෙන ඒමේදී දරන්නට සිදුවන වියදම්ද ඇතුළුව එකී වත්කම් හී අත්පත් කර ගැනීමේ හෝ ඉදිකිරීමේ පිරිවැයයි. අනෙක් සියළුම අළුත්වැඩියා සහ නඩත්තු පිරිවැය හටගන්නා අවස්ථාවේදී ලාභ හෝ පාඩු ලෙස හඳුනා ගනු ලබයි.

**ක්ෂය**
හීනවන ක්ෂය ක්‍රමය භාවිතා කරමින් භාවිතා කළ හැකි ජීව කාලය මත වත්කමෙහි ඉතිරි වටිනාකම අඩුකර පිරිවැය ලියා හැරිය හැකිවනසේ ක්ෂය විස්තීර්ණ ආදායම් ප්‍රකාශයට ගන්නා අතර මිලට ගත් වසරේදී ක්ෂය ප්‍රතිපාදන නොකරනු ලබයි. ඇස්තමේන්තු ගත භාවිත කාලය, ඉතිරි වටිනාකම සහ ක්ෂය ක්‍රමය සෑම වසරක් අවසානයේ භව්‍යතා පදනමකින් ඇස්තමේන්තුවේ කවර හෝ වෙනස්වීමක බලපෑම සලකමින් සමාලෝචනය කරනු ලබයි. දේපල, පිරියත සහ උපකරණයන්හී ඇස්තමේන්තුගත භාවිත ජීව කාලය පහත පරිදි වේ;

| ස්පෘෂ්‍ය වත්කමෙහි පංතිය | භාවිතා කල හැකි ජීව කාලය |
|---|---|
| ලී බඩු සහ උපකරණ | වසර 10 |
| කාර්යාල උපකරණ | වසර 5 |
| පරිගණක සහ මෘදුකාංග | වසර 4 |
| මෝටර් වාහන | වසර 5 |

නැවත හඳුනාගැනීම

අපහරණය කරනු ලබන අවස්ථාවේදී හෝ වත්කමෙන් එහි භාවිතය තුළින් අනාගත ආර්ථික ප්‍රතිලාභ අපේක්ෂා නොකරන අවස්ථාවන්හිදී දේපල, පිරියත සහ උපකරණ නැවත හඳුනාගැනීම කරනු ලබයි. කිසියම් දේපල,පිරියත හෝ උපකරණ නැවත හඳුනාගැනීමකදී වන ලාභ හෝ පාඩුව තීරණය කරනු ලබන්නේ වත්කමෙහි විකුණුම් මුදල සහ ඉදිරියට ගෙනා වටිනාකම අතර වෙනස මගිනි. එය විස්තීර්ණ ආදායම් ප්‍රකාශයට ගනු ලබයි.

### 2.8.4. ගෙවිය යුතු සහ ලැබිය යුතු ණය ප්‍රදාන ක්‍රමක්ෂය කිරීම

ගෙවිය යුතු ණය මගින් නිරූපණය වනුයේ පළාත් පාලන අධිකාරීන් වෙත ලබාදීම සඳහා 'ආ' සංරචකය යටතේ ආසියානු සංවර්ධන බැංකුවේ ණය සමග LGIIP ව්‍යාපෘතිය වෙතින් ලැබෙනා ශ්‍රී ලංකා රජයේ අරමුදල්ය. ලැබිය යුතු ණය මගින් නියෝජනය වනුයේ ණය සංරචකය සමග පළාත් පාලන අධිකාරීන් වෙත බෙදා හැරි ප්‍රදානයන්ය. වියදමක් ලෙස සලකනු ලබන ලැබිය යුතු ණය ප්‍රදාන එකී ක්‍රියාකාරකමෙන් පොලී ලැබෙනා වසර ගණනාව පුරා ක්‍රමානුකූල පිලිවෙලකට ආදායම් ප්‍රකාශය තුළ විලම්භනය සහ ක්‍රමක්ෂය කරනු ලබයි. ගෙවිය යුතු ණයද මේ ක්‍රමය යටතේම ක්‍රමක්ෂය කරනු ලබයි. මෙහිදී දේශීය ණය සහ සංවර්ධන අරමුදලේ ඒකාබද්ධ බදු වලට පෙර ලාභය බදු පෙර සහ ශුද්ධ ක්‍රමක්ෂය ලාභයෙන් 5% ට වඩා අඩු නොවිය යුතුය.

දේශීය ණය සහ සංවර්ධන අරමුදල
2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වසර සඳහා
ගිණුම්කරණ ප්‍රතිපත්ති

**2.8.5. බඩු වට්ටෝරු**

බඩු වට්ටෝරු මගින් රුපියල් 5000 ට වඩා අඩු වටිනාකමින් යුත් අයිතමයන් නියෝජනය කෙරෙන අතර ඒවා දේපල, පිරියත සහ උපකරණ ලෙස හඳුනාගත නොහැකිය. තවද බඩු වට්ටෝරු පොතෙහි වර්ගීකරණය පිණිස වත්කමෙහි ජීවිකාලය සැලකිල්ලට ගනු ලබයි. යම් වත්කමක ජීව කාලය සැලකිය යුතු දුරකට ගමන් නොකරන්නේ නම් එහි පිරිවැය වියදමක් ලෙස සලකා විස්තීර්ණ ආදායම් ප්‍රකාශයෙහි දක්වනු ලබයි.

**2.8.6. පශ්චාත් සේවා නියුක්ති ප්‍රතිලාභ වගකීම්**

ඒ) තීරණය කරන ලද ප්‍රතිලාභ සැලැස්ම -පාරිතෝෂික

පාරිතෝෂික යනු නිර්ණය කරන ලද ප්‍රතිලාභ සැලසුමකි. අරමුදල වාර්ෂිකව පාරිතෝෂික ලෙස පොරොන්දුව ඇති විශ්‍රාම ප්‍රතිලාභ වල වර්තමාන වටිනාකම ගණනය කර බලයි. එය නිර්ණය කරන ලද ප්‍රතිලාභ සැලසුමකි. නිර්ණය කරන ලද ප්‍රතිලාභ සැලසුම යටතේ ප්‍රතිලාභ සැලසීම පිණිස වන පිරිවැය තීරණය කරනු ලබන්නේ ආයු ගණක තක්සේරුකරුවකුගේ විශේෂඥ දැනුම භාවිතා කරමින් ව්‍යාපෘති ඒකක ණය ක්‍රමය මගිනි.

නිර්ණය කරනු ලබන ප්‍රතිලාභ සැලසුමක ආයුගණක වාසි සහ පාඩු වෙනත් විස්තීර්ණ ආදායම් තුළ හටගන්නා කාල පරිච්ඡේදය තුළ පූර්ණ ලෙසම හඳුනා ගැනේ.
මෙකී පාරිතෝෂික වගකීම සඳහා අභ්‍යන්තර හෝ බාහිර අරමුදල් නොසැපයේ.

ඉ) නිර්ණය කරන දායකත්ව සැලසුම - සේවක අර්ථසාධක අරමුදල සහ සේවා නියුක්තිකයන් ගේ භාර අරමුදල අදාල නීති රීති හා රෙගුලාසි වලට අනුව සේවක අර්ථසාධක අරමුදල සහ සේවා නියුක්තිකයන් ගේ භාර අරමුදල ට දායකත්වයන් ගෙවීමට සේවකයන් හිමිකම් ලබයි.

**2.8.7. ප්‍රතිපාදන**

පසුගිය සිදුවීමක ප්‍රතිපලයක් ලෙස අරමුදලට වර්තමාන බැදීමක් (නෛතික හෝ සකාර්ය) ඇති විට සහ එකී බැදීම පියවීම පිණිස ආර්ථික ප්‍රතිලාභ සහිත සම්පත් බැහැරට ගලා යායුතු වන්නාවූ තත්වයක් පවතින විට මෙන්ම එකී බැදීමෙහි ප්‍රමාණය සම්බන්ධයෙන් විශ්වසනීය ඇස්තමේන්තුවක් පිලියෙල කිරීමට හැකි විටක ඒ සඳහා ප්‍රතිපාදන හඳුනා ගැනේ.

**2.8.8. වෙනත් මූල්‍ය නොවන වත්කම්**

වෙනත් සියළු මූල්‍ය නොවන වත්කම් එහි ඉදිරියට ගෙනා වටිනාකම ඇස්තමේන්තුගත මුදල් කල හැකි වටිනාකමට අඩු කළ හැකිවන සේ අවශ්‍ය අවස්ථාවන්හිදී විශේෂිත ප්‍රතිපාදන මත අගයනු ලැබේ.

**2.8.9. වෙනත් මූල්‍ය නොවන වගකීම්**

වෙනත් මූල්‍ය නොවන වගකීම් එහි සාමාන්‍ය ප්‍රමාණය අනුව හඳුනා ගැනේ.

**2.8.10. මූල්‍ය නොවන වත්කම් අපහායනය**

කිසියම් වත්කමක් සඳහා අපහායනයක් පිලිබඳ අවශ්‍යතාවක් වේදැයි බලා ගනු පිණිස අරමුදල සෑම වාර්තාකරණ දිනයකම තක්සේරුවක් සිදු කරයි. එසේ අපහායනයක් කළ යුතු යයි ඇඟවුමක් වේ නම් එසේත් නැතිනම් කිසියම් වත්කමක් සඳහා වාර්ෂික අපහායන පරීක්ෂාවක් අවශ්‍ය වේ නම් අරමුදල වත්කමෙන් අයකරගත හැකි වටිනාකම සම්බන්ධයෙන් තක්සේරුවක් සිදු කරයි. යම් වත්කමක එසේ අයකරගත හැකි වටිනාකම එකී වත්කමෙහි භාවිත වටිනාකම සහ විකුණුම් පිරිවැය අඩු කල පසු සාධාරණ අගයට වඩා වැඩි විය යුතුය. අනෙක් වත්කම් හෝ වත්කම් සමූහයන් ගෙන් විශාල වශයෙන් ස්වාධීන වන්නාවූ මුදල් ගලා ඒමක් උත්පාදනය නොවන්නේ නම් තනි තනි වත්කම් ලෙස ගැනීමට තීරණ කරනු ලබයි. කිසියම් වත්කමක ඉදිරියට ගෙනා වටිනාකම එහි අයකරගත හැකි වටිනාකම ඉක්මවා යන අවස්ථාවන්හිදී වත්කම අපහායනය කරන ලදැයි සැලකෙන අතර එය එහි අයකරගත හැකි වටිනාකමට ගිණුම්ගත කරනු ලබයි.

දේශීය ණය සහ සංවර්ධන අරමුදල

2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වසර සඳහා
ගිණුම්කරණ ප්‍රතිපත්ති

## 2.8.11. මූල්‍ය උපකරණ-මූලික හඳුනාගැනීම සහ අනුෂාංගික මිණුම්

අරමුදලේ මූල්‍ය උපකරණ ණය, ලැබිය යුතු දෑ සහ වෙනත් මූල්‍ය වගකීම් වලින් සමන්විත වන අතර එහි අනුෂාංගික මිණුම් අපහායනය සහ නැවත හඳුනාගැනීම් පිලිබඳ ගිණුම්කරන ප්‍රතිපත්ති පහත දැක්වේ.

i) **මූල්‍ය වත්කම්**

ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිති 39 තුළ, මූල්‍ය වත්කම් මූලික හඳුනාගැනීමේදී සිය මූල්‍ය වත්කම් වර්ගීකරණය සුදුසු ලෙස තීරණය කරනු ලබන ආකාරයට ලාභ හෝ අලාභ, ණය සහ ලැබිය යුතු දෑ, කල් පිරෙනතුරු රඳවාගන්නා ආයෝජන සහ විකුණුම් සඳහා ඇති මූල්‍ය වත්කම් තුළින් සාධාරණ අගය මත මූල්‍ය වත්කම් ලෙස වර්ගීකරණයට ලක් කෙරේ. සියළු මූල්‍ය වත්කම් ආරම්භයේදී සාධාරණ අගය සහ (සාධාරණ අගය මත නොමැති වත්කම් සම්බන්ධයෙන් ලාභ හෝ අලාභ මත) ඍජුව ආරෝපණය කළ හැකි ගනුදෙනු පිරිවැයෙහි එකතුව මත හඳුනා ගැනේ.

**ණය සහ ලැබිය යුතු දෑ**

ණය සහ ලැබිය යුතු දෑ යනු සක්‍රීය වෙළඳපලෙක මිල සඳහන් නොවන ස්ථාවර හෝ නීර්ණය කල හැකි ගෙවුම් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් වේ. ආරම්භක මිණුමින් පසු අපහායන අගය අඩු කර සඵලදායි පොලී අනුපාත ක්‍රමය භාවිතා කරමින් එවන් මූල්‍ය වත්කම් පසුව ක්‍රමක්ෂය පිරිවැය මත පසුව මණිනු ලැබේ. මෙකී ක්‍රමක්ෂය පිරිවැය ගණනය කරනු ලබන්නේ අත්පත්කර ගැනීම මත වන වට්ටම් හෝ වාරික සහ සඵලදායි පොලී අනුපාතයෙහි ඒකාබද්ධ කොටසක් වන ගාස්තු හෝ පිරිවැය සැලකිල්ලට ගනිමිනි. මෙකී සඵලදායි පොලී අනුපාත ක්‍රමය යටතේ වන ක්‍රමක්ෂය විස්තීර්ණ ආදායම් ප්‍රකාශයෙහි මූල්‍ය ආදායම තුළ ඇතුලත් වේ. අපහායනයෙන් පැන නගින්නාවූ පාඩු විස්තීර්ණ ආදායම් ප්‍රකාශයෙහි හඳුනාගැනේ. ණය සහ ලැබිය යුතු දෑ මූල්‍ය තත්ව ප්‍රකාශයෙහි ඉදිරිපත් කෙරේ.

**නැවත හඳුනාගැනීම**

පහත අවස්ථාවලදී මූල්‍ය වත්කමක් හඳුනාගැනේ (එසේ නැතිනම් අදාල වන පරිදි මූල්‍ය වත්කමක කොටසක් හෝ සමාන මූල්‍ය වත්කම් සමූහයක කොටසක් )

i. වත්කමෙන් මුදල් ප්‍රවාහ ලබා ගැනීමට ඇති අයිතිය කල්පැන ඇති විට.
ii. අරමුදල වත්කමෙන් මුදල් ප්‍රවාහ ලැබීමට ඇති තම අයිතිය මාරු කර ඇති විට හෝ තෙවන පාර්ශවයකට 'pass-through' වැඩපිලිවෙලක් හරහා භෞතික ප්‍රමාදයකින් තොරව ලද මුදල් ප්‍රවාහයත් පූර්ණ වශයෙන්ම වගකීමක් සඳහා ගෙවීමට භාරගෙන ඇති විට සහ

අ)අරමුදල වත්කමෙහි අවදානම් සහ ප්‍රතිලාභ සියල්ලම මාරු කර ඇති විට හෝ

ආ)අරමුදල වත්කමෙහි සියළු අවදානම් හෝ ප්‍රතිලාභ බොහෝ කොට මාරු කර හෝ රඳවා තබාගෙන නොමැති එහෙත් වත්කමෙහි පාලනය මාරු කර ඇති විට.

**මූල්‍ය වත්කම් අපහායනය**

ගිණුම්කරන කර්තව්‍යය උදෙසා දේශීය ණය සහ සංවර්ධන අරමුදල අපහායනය කරන ලද මූල්‍ය වත්කම් මත පාඩු හඳුනාගැනීම පිණිස හටගත් පාඩු ආකෘතියක් (incurred loss model) භාවිතා කරයි. මෙහි අර්ථය වනුයේ පාඩු හඳුනාගත හැක්කේ විශේෂිත පාඩු සිදුවීමක් පිලිබඳ වාස්තවික සාක්ෂියක් නිරීක්ෂණය කර ඇත්තේ නම් පමණි. එවන් සිදුවීම් වලට පහත දෑ ඇතුලත් වේ.

දේශීය ණය සහ සංවර්ධන අරමුදල

2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වසර සඳහා
ගිණුම්කරණ ප්‍රතිපත්ති

- පාරිභොගිකයාගේ කැපී පෙනෙන මූල්‍ය දුෂ්කරතාවක් (පලාත් පාලන අධිකාරිය)
- ගෙවීම් පැහැර හැරීම වැනි ගිවිසුම් උල්ලංඝණයක්
- පලාත් පාලන ආයතනය මූල්‍ය දුෂ්කරතාවක් අත්විඳීම හේතුවෙන් දේශීය ණය සහ සංවර්ධන අරමුදල පලාත් පාලන අධිකාරියට සහනයක් පිරිනමන විට
- පළාත් පාලන අධිකාරිය මූල්‍ය දුෂ්කරතාවන්ට මුහුණ දීමට සිදුවිය හැකි අවස්ථාවක
- ණය වලින් එන ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන්ගේ අඩුවීමක් ඇතැයි නිරීක්ෂණය කළ හැකි දත්ත මගින් පෙනෙන විට
- කොමසාරිස් මණ්ඩලය පළාත් පාලන අධිකාරියට දෙන ලද ණය පිලිබඳ සීමා පනවා ඇති විට
- තනි තනිව තක්සේරු කරන ලද දීමනා

දේශීය ණය සහ සංවර්ධන අරමුදල සෑම තනි තනි වැදගත් ණය සහ ලැබිය යුතු දෑ සඳහා වෙන් වෙන් පදනමින් සුදුසු දීමනා තීරණය කරයි.සැලසුමෙහි තීරණය කරනු ලබන දීමනා ප්‍රමාණයට ප්‍රතිපාර්ශවයෙහි ව්‍යාපාරික සැලසුමෙහි තිරසරභාවය, එය මූල්‍ය දුෂකරතාවකට මුහුණ පා ඇති විටක කාර්යසාධනය වර්ධනය කිරීමට ඇති හැකියාව, පුරෝකථිත ලැබීම් සහ අපේක්ෂිත වියදම් හේතුවෙන් බංකොළොත්බවට ඉඩ ඇති විට, වෙනත් මූල්‍ය සහයක් සඳහා ඇති ඉඩ, මුදල් කල හැකි ඇප වල වටිනාකම සහ අපේක්ෂිත මුදල් ප්‍රවාහයෙහි කාලය ඇතුලත් වන විට අයිතම සලකා බලයි. කල්තබා කිව නොහැකි තත්වයන් හේතුවෙන් වඩා පරීක්ෂාකාරී අවධානයක් ඉල්ලා නොසිටින්නේ නම් සෑම වාර්තාකරණ දිනයකදීම අපහායන දීමනා අගයනු ලබයි.

දේශීය ණය සහ සංවර්ධන අරමුදලේ කළමණාකාරීත්වය රු මිලියන 10 ක ප්‍රවේශ සීමාව තීරණය කරයි.

**සාමූහිකව තක්සේරු කරන ලද දීමනා**

අපහායනය නොකරන ලද්දේ යයි හඳුනාගන්නා, සහ වෙන් වෙන් වශයෙන් තක්සේරු කරන ලද , වෙන් වෙන් වශයෙන් වැදගත් නොවන්නාවූ පාඩු සහ ණය වෙනුවෙන් සාමූහිකව දීමනා ත්කසේරු කෙරේ.සාමූහික අපහායන වෙනුවෙන් ශේෂ පත්‍ර දිනට ක්‍රමක්ෂය පිරිවැයට ණයගැතියන් සඳහා 1% දීමනාවක් ප්‍රතිපාදනය කෙරේ.

**ක්‍රමක්ෂය පිරිවැයට ඉදිරියට ගෙනෙනා මූල්‍ය වත්කම්**

ක්‍රමක්ෂය පිරිවැයට ඉදිරියට ගෙනෙනා මූල්‍ය වත්කම් සම්බන්ධයෙන් ගත් කල, වෙන් වෙන් වශයෙන් වැදගත් වන්නාවූ මූල්‍ය වත්කම් සඳහා වෙන් වෙන්ව අපහායනයන් පවතින්නේද නැතිනම් වෙන් වෙන් වශයෙන් වැදගත් නොවන්නාවූ මූල්‍ය වත්කම් සඳහා සාමූහික වශයෙන් අපහායන පවතින්නේද යන්න ගැන වාස්තවික සාක්ෂි තිබෙන්නේදැයි අරමුදල පළමුවෙන්ම තක්සේරු කරයි. යම් හෙයකින් අරමුදල වෙන් වෙන් වශයෙන් තක්සේරු කරන ලද මූල්‍ය වත්කමක් සම්බන්ධයෙන් අපහායනයක් පවතින බවට වාස්තවික සාක්ෂි නැතැයි අරමුදල තීරණය කරන්නේ නම්, එය වැදගත් වුවද නැතද, ඊට සමාන ණය අවදානම් ලක්ෂණ ඇති මූල්‍ය වත්කම් සමූහයක් තුළ වත්කම ඇතුලත් කරන අතර අපහායන කාර්යය සඳහා එය සාමූහිකව තක්සේරු කෙරේ.

යම් හෙයකින් අපහායන පාඩුවක් හට ගෙන ඇතැයි යන්නට වාස්තවික සාක්ෂි ඇතොත් පාඩුවේ ප්‍රමාණය වත්කමෙහි ඉදිරියට ගෙනා වටිනාකම සහ ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයේ වර්තමාන වටිනාකම අතර වෙනස ලෙස මණිනු ලැබේ (තවමත් හටගෙන නැති අනාගතයේදී අපේක්ෂිත ණය පාඩු බැහැර කර) මූල්‍ය වත්කමෙහි නියම සඵලදායී පොලී අනුපාතයට ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයේ වර්තමාන අගය වට්ටම් කෙරේ.

දේශීය ණය සහ සංවර්ධන අරමුදල

2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වසර සඳහා
ගිණුම්කරණ ප්‍රතිපත්ති

ii) **මූල්‍ය වගකීම්**

ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිති 39 යෙහි විෂය පථය තුළ මූල්‍ය වගකීම් පොලී සහිත ණය දීම් සහ ණය ගැනීම් ලෙස සහ ගැලපෙන පරිදි වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ ලෙස වර්ග කෙරේ. අරමුදල ආරම්භක හඳුනාගැනීමේදී සිය මූල්‍ය වගකීම් වර්ගීකරණයට ලක් කරන ආකාරය තීරණය කරයි.
වගකීමෙහි ගිවිසුම්ගත ප්‍රතිපාදනයට කොටස්කරුවකු බවට අරමුදල පත්වූ විට අරමුදල මූල්‍ය වගකීම් හඳුනාගන්නා අතර මූල්‍ය වගකීම්වල නිර්වචනයන්ට අනුව ගිවිසුම්ගත වැඩපිළිවෙලෙහි හරය අනුව යමින් මූල්‍ය වගකීම් වෙනත් මූල්‍ය වගකීම් ලෙස වර්ගීකරණය කරයි.

**මූල්‍ය වත්කම් නැවත හඳුනාගැනීම**

වගකීම යටතේ වන බැඳීම නිදහස් කිරීම, අවලංගු කිරීම හෝ කල් ඉකුත් වීම මත මූල්‍ය වගකීමක් නැවත හඳුනාගැනේ. පැහැදිලිවම වෙනස් වූ කොන්දේසි මත නැතිනම් පවත්නා වගකීමෙහි කොන්දේසි නවීකරණය කිරීම මත එකම ණය දෙන්නකුගෙන් ගත් වෙනත් ණයක් මගින් පවත්නා මූල්‍ය වගකීම විතැන් කරනු ලබද්දී එවන් නවීකරනයක් මගින් කෙරෙනා හුවමාරුවක් නියම වගකීම නැවත හඳුනාගැනීමක් ලෙසත් නව වගකීමක් හඳුනාගැනීමක් ලෙසත් සලකනු ලබයි. මුල් මූල්‍ය වගකීමෙහි ඉදිරියට ගෙනා වටිනාකම සහ ගෙවනු ලබන ප්‍රතිෂ්ඨාව අතර වෙනස විස්තීර්ණ ආදායම් ප්‍රකාශයෙහි හඳුනා ගනු ලබයි.

iii) **සාධාරණ අගය මැනීම**

වෙළඳපල සහභාගි වන්නන් අතර මණිනු ලබනා දිනයට විධිමත් ගණුදෙනුවක් තුළ වත්කමක් විකිණීමට ලැබෙනා මිල හෝ වගකීමක් පැවරීමට ගෙවනු ලබනා මිල සාධාරණ අගය ලෙස සලකනු ලබයි. මෙකී සාධාරණ අගය පිළිබඳ මිණුම වත්කම විකිණීම හෝ වගකීම පැවරීම යන දෙක.

- වත්කමට හෝ වගකීමට අදාල ප්‍රධාන වෙළඳපල තුළ හෝ
- ප්‍රධාන වෙළඳ පලක් නැති තත්වයකදී වත්කම හෝ වගකීමට වඩාත්ම වාසිදායක වෙළඳපල තුළ යන දෙකින් එකක සිදුවන්නේය යන උපකල්පනය මත පදනම් වෙයි. මෙහිදී ප්‍රධාන හෝ වඩාත් වාසිදායක වෙළඳපල යනු අරමුදලට ප්‍රවේශ විය හැකි එකක් වීම අනිවාර්යය වේ.

වත්කමක් හෝ වගකීමක් මිල කරද්දී වෙළඳපල සහභාගිවන්නන් සිය හොඳම ආර්ථික වාසිය තුළ කටයුතු කරන්නේ ය යන උපකල්පනය මත පිහිටා වත්කමක හෝ වගකීමක සාධාරණ අගය මණිනු ලැබේ. මූල්‍ය නොවන වත්කමක සාධාරණ අගය මැනීමේදී වත්කම එහි උපරිම සහ හොඳම භාවිතයට යොදා ගැනීම මගින් නැතිනම් එය ඉහලම සහ හොඳම භාවිතයට යොදා ගත හැකි තවත් වෙළඳපල සහභාගි වන්නකු හට විකිණීම මගින් වෙළඳපල සහභාගිවන්නකුට ආර්ථික ප්‍රතිලාභ උත්පාදනය කිරීමට ඇති හැකියාව සැලකිල්ලට ගනු ලබයි.

අදාල නිරීක්ෂණය කල හැකි යෙදවුම් උපරිම කරමින් සහ නිරීක්ෂණය කළ නොහැකි යෙදවුම් අවම කරමින් අරමුදල සාධාරණ අගය මැනීම පිණිස ප්‍රමාණවත් දත්ත තිබෙනා සහ පවත්නා තත්වයන් තුළ යෝග්‍ය වන්නාවූ අගැයුම් තාක්ෂණවේදයන් සහ භාවිත කරයි.

මූල්‍ය ප්‍රකාශයන් තුළ සාධාරණ අගය මණිනු ලබනා හෝ අනාවරණය කරනු ලබනා සියළු වත්කම් සහ වගකීම් සමස්තයක් වශයෙන් සාධාරණ අගය මිණුමට වැදගත් වන්නාවූ අවම යෙදවුම් මට්ටම මත පදනම්ව සාධාරණ අගය පිළිබඳ ධූරාවලිය තුළ පහත පරිදි වර්ගීකරණයට ලක් කෙරේ.

- මට්ටම 1- අනන්‍ය වත්කම් හෝ වගකීම් සඳහා සක්‍රිය වෙළඳපල තුළ ඉදිරිපත් වන (ගැලපුම් නොකරන ලද) මිලගණන්
- මට්ටම 1 2 - ඍජුව හෝ වක්‍රව නිරීක්ෂණය කළ හැකි සාධාරණ අගය මිණුමට වැදගත් වන්නාවූ පහළම මට්ටමේ යෙදවුම් සඳහා වන අගැයුම් තාක්ෂණවේදයන්
- මට්ටම1 3 - සාධාරණ අගය අනාවරණය කිරීමේ කාර්යය සඳහා නිරීක්ෂණය කළ නොහැකි වන්නාවූ සාධාරණ අගය මිණුමට වැදගත්වන්නාවූ පහලම මට්ටමේ යෙදවුම්

දේශීය ණය සහ සංවර්ධන අරමුදල

2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වසර සඳහා
ගිණුම්කරණ ප්‍රතිපත්ති

- සඳහා අගැයුම් තාක්ෂණවේදයන්, වත්කම් සහ වගකීම්වල ස්වභාවය, නෛසර්ගික ලක්ෂණ සහ අවදානම් සහ ඉහත විස්තර කර ඇති පරිදි වන සාධාරණ අගය පිලිබඳ ධූරාවලියෙහි මට්ටම මත පිහිටා අරමුදල වත්කම් සහ වගකීම් වල පංති තීරණය කර ඇත. සාධාරණ අගය මත මණිනු ලබනා ආයෝජන දේපල, සහ වෙනත් දේපල පිරියත සහ උපකරණ වැනි දෙකම සඳහා වන පුනරාවර්තන සාධාරණ අගය මිණුම් සඳහා අරමුදලේ කොමසාරිස් මණ්ඩලය ප්‍රතිපත්ති සහ පරිපාටි තීරණය කරයි.

වැදගත් වත්කම් තක්සේරු කිරීම සඳහා බාහිර තක්සේරු විශේෂඥයන් යොදවා ගනු ලබයි. කොමසාරිස් මණ්ඩලය අරමුදලේ කළමණාකාරීත්වය සමග සාකච්ඡා කර ඔවුන්ගේ අනුමැතිය ලබා ගැනීමෙන් පසු වාර්ෂිකව මෙකී විශේෂඥ දැනුමින් යුත් බාහිර තක්සේරුකරුවන්ගේ මැදිහත්වීම ගැන තීරණය ගනු ලබයි. වෙළඳපල පිලිබඳ දැනුම, පිලිගැනීම, ස්වාධීනත්වය, සහ වෘත්තීය ප්‍රමිති පවත්වාගෙන යන්නේද යන කරුණු තෝරා ගැනීමේ නිර්ණායකයන් තුළ ඇතුලත් වේ. බාහිර තක්සේරු විශේෂඥයන් සමග සාකච්ඡා කිරීමෙන් පසුව කොමසාරිස් මණ්ඩලය එක් එක් දෑ සම්බන්ධයෙන් කවර තක්සේරු තාක්ෂණවේදයන් සහ යෙදවුම් භාවිතා කරන්නේදැයි තීරණය කරයි.

කොමසාරිස් මණ්ඩලය සෑම වාර්තාකරණ දිනයකදීම අරමුදලේ ගිණුම්කරන ප්‍රතිපත්ති අනුව නැවත මිණුම් කිරීමට හෝ නැවත තක්සේරු කිරීමට අවශ්‍ය වන්නාවූ වත්කම් සහ වගකීම් හී සංචලනයන් විශ්ලේෂණයට ලක් කරයි. අනෙක් අදාල ලේඛණ සහ ගිවිසුම් අගැයුම් ගණනයට ඇති තොරතුරු සමග එකඟවෙමින් මෙකී විශ්ලේෂණය සඳහා කොමසාරිස් මණ්ඩලය නවතම අගැයුමේදී භාවිතා කරන ලද ප්‍රධාන යෙදවුම් සත්‍යාපනය කරයි. අරමුදලේ බාහිර තක්සේරු විශේෂඥයන් සමග එක්වෙමින් අරමුදලේ කොමසාරිස් මණ්ඩලය ඇති ව තිබෙනා වෙනස්කම් සාධාරණදැයි තීරණය කිරීම පිණිස බාහිර අදාල මූලශ්‍රයන් සමගින් සෑම වත්කමක් සහ වගකීමක සාධාරණ අගයෙහි වෙනස සංසන්දනය කර බලයි.

සාධාරණ අගය පිලිබඳ අනාවරණයන් උදෙසා අරමුදල වත්කම හෝ වගකීමෙහි ස්වභාවය, නෛසර්ගික ලක්ෂණ සහ අවදානම සහ ඉහත විස්තර කර ඇති පරිදි සාධාරණ අගය පිලිබඳ ධූරාවලියෙහි මට්ටම මත පදනම්ව වත්කම් සහ වගකීම්වල පංතිය තීරණය කරයි.

### 2.8.12. ආදායම හඳුනාගැනීම

අරමුදලට ආර්ථික ප්‍රතිලාභ ගලා ඒම සඳහා ඉඩක් තිබේද යන්න සහ ගෙවීම කරනු ලබන අවස්ථාව සැලකිල්ලට නොගෙන, ආදායම සහ සිදුවන හෝ සිදුවිය හැකි ආශ්‍රිත පිරිවැය විශ්වසනීය අයුරින් ගණනය කළ හැකිද යන්න තීරණය වන දුරට ආදායම හඳුනා ගැනේ. ආදායම හඳුනාගැනීමේ කාර්යය උදෙසා පහත සඳහන් විශේෂිත නිර්ණායක උපයෝගී කර ගැනේ.

#### අ) පොලී ආදායම සහ වියදම්

උපචිත පදනම සහ සඵලදායී පොලී ක්‍රමය භාවිතා කරමින් පොලී ආදායම සහ වියදම විස්තීර්ණ ආදායම් ප්‍රකාශයට හඳුනාගනු ලබයි. සඵලදායී පොලී අනුපාතය යනු මූල්‍ය වත්කම සහ වගකීමේ ඉදිරියට ගෙනා වටිනාකමට මූල්‍ය වත්කමේ හෝ වගකීමේ අපේක්ෂිත ජීව කාලය තුළින් ඇස්තමේන්තුගත අනාගත මුදල් ගෙවීම් සහ ලැබීම් නියත ලෙස වට්ටම් කරනා අනුපාතයයි. (නැතිනම් අදාල වන පරිදි කෙටි කාලය) සඵලදායී පොලී අනුපාතය ගණනය කිරීමේදී අරමුදල අනාගත ණය පාඩු නොව මූල්‍ය උපකරණවල සියළු ගිවිසුම් කොන්දේසි සැලකිල්ලට ගනිමින් අනාගත මුදල් ප්‍රවාහ ඇස්තමේන්තු කරයි.

මෙසේ සඵලදායී පොලී අනුපාතය ගණනය කිරීමට ගෙවන ලද හෝ ලැබුණ සියළු ගාස්තු සහ ලකුණු ඇතුලත් වන අතර ඒවා සඵලදායී පොලී අනුපාතයෙහි ඒකාබද්ධ කොටසක් වේ. ගණුදෙනු පිරිවැයට මූල්‍ය වත්කමක් හෝ වගකීමක් අත්පත් කර ගැනීමට හෝ නිකුත් කිරීමට සෘජුව ආරෝපණය කළ හැකි වැඩිවන පිරිවැය ඇතුලත් වේ.

දේශීය ණය සහ සංවර්ධන අරමුදල

2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වසර සඳහා
ගිණුම්කරණ ප්‍රතිපත්ති

**ආ) වෙනත් ආදායම්**

වෙනත් ආදායම් උපචිත පදනමින් ගිණුම් ගත කරනු ලබයි. මෙකී වෙනත් ආදායම් යන්නට දඩ සහ බේරුම් කරන ලද හානි හේතුවෙන් ලත් ආදායම් , ප්‍රාග්ධන ප්‍රදාන ක්‍රමක්ෂය සහ අන් කවර හෝ මෙහෙයුම් නොවන ආදායම් ඇතුලත් විය.

**2.8.13. වියදම් හඳුනාගැනීම**

හටගත් පිරිවැය සහ විශේෂ ආදායම් අයිතමයන්හී ඉපයුම් අතර වන ඍජු සම්බන්ධතාව පදනම් කරගෙන වියදම විස්තීර්ණ ආදායම් ප්‍රකාශයෙහි හඳුනාගැනේ. ව්‍යාපාර කටයුතු කරගෙන යාමෙන් සහ කාර්යක්ෂම අනුපාතයකින් දේපල, පිරියත සහ උපකරණ නඩත්තු කිරීමෙන් හටගන්නා වියදම් වසරේ ලාභ ලැබීමේදී ආදායමින් අයකර ඇත.

විස්තීර්ණ ආදායම් ප්‍රකාශය ඉදිරිපත් කිරීමේ කාර්යය උදෙසා කොමසාරිස්වරුන් දරන මතය වනුයේ වියදම් ක්‍රමවේදයෙහි ස්වභාවය මගින් අරමුදලේ කාර්යසාධනය සාධාරණ ලෙස ඉදිරිපත් කරනු ලබන බවත් එහෙයින් එවැනි ඉදිරිපත් කිරීමේ ක්‍රමයක් අදාල කරගත් බවත්ය. වියදම සිදුවූ වසර තුළදී අලුත්වැඩියා සහ අලුත් කිරීම් විස්තීර්ණ ආදායම් ප්‍රකාශයට අයකරනු ලැබේ.

**2.8.14. මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිති -7 (LKAS – 7), ‘මුදල් ප්‍රවාහ ප්‍රකාශය අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශ පිලියෙල කිරීමේ වක්‍ර ක්‍රමය භාවිතා කරමින් මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිලියෙල කර ඇත.

අතැති මුදල්, බැංකුවේ ඇති මුදල් සහ සාධාරණ අගය තුළ කැපී නොපෙනෙනා අවදානම් වෙනස්වීම් වලට යටත්වන මාස තුනට අඩු කල් පිරීම් සහිත කෙටි කාලීන මුදල් අවශ්‍යතා සපුරා ගැනීම පිණිස රඳවා ගනු ලබනා ඉහල ද්‍රවශීලතාවකින් යුත් මූල්‍ය වත්කම් යනාදියෙන් මුදල් සහ මුදල සමාන දෑ සමන්විත වේ.

**2.8.15. අදාල පාර්ශව අනාවරණයන්**

අදාල පාර්ශව සමග ගණුදෙනු සාමාන්‍ය ව්‍යාපාර කටයුතු තුළ පවත්වාගෙන යනු ලැබේ.

**2.8.16. බැඳීම් සහ අසම්භාව්‍ය බැරකම්**

සියළු දැන සිටින වගකීම් ප්‍රමාණයන් තීරණය කිරීමේදී අවබෝධ කරගත හැකි සියළු අවදානම් සැලකිල්ලට ගනු ලැබේ. අසම්භාව්‍ය බැරකම් යනු ඇතිවිය හැකි බැරකම් වන අතර ආර්ථික ප්‍රතිලාභ මාරු කිරීම කළ නොහැකි හෝ විශ්වසනීය ලෙස මැණිය නොහැකි විටදී අවිනිශ්චිත අනාගත සිදුවීම් හෝ වර්තමාන වගකීම් මගින් පමණක් ඒවායේ පැවැත්ම තහවුරු කෙරේ. අසම්භාව්‍ය බැරකම් මූල්‍ය තත්ව ප්‍රකාශයෙහි හඳුනා නොගන්නා නමුදු ඒවා දුරස්ථ නොවේ නම් අනාවරණය කෙරේ.